# වාර්ෂික වාර්තාව
# 2012

# පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| 1. | ඉතිහාසය | 1 - 2 |
| 2. | දැක්ම, මෙහෙවර සහ අරමුණ | 2 - 3 |
| 3. | මාණ්ඩලික විද්‍යාලයේ ක්‍රියාකාරකම් සංවිධාන ව්‍යුහය | 4 - 5 |
| 4. | විෂය නිර්දේශය | 6 - 7 |
| 5. | පුහුණු ක්‍රියාකාරකම් | 7 - 33 |
| 6. | පාලන සහ භාඩ කාර්ය සම්පාදනය | 34 - 40 |
| 7. | නිර්දේශ | 40 - 41 |

ඇමුණුම් :

| | | |
|---|---|---|
| අ. | ගණකාධිකාරිගේ ප්‍රකාශය | අ 1 - අ 3 |
| ආ. | අභ්‍යන්තර විගණකගේ ප්‍රකාශය | ආ 1 |
| ඇ. | මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය | ඇ 1 - ඇ 11 |
| ඈ. | විගණකාධිපති වාර්තාව | ඈ 1 - ඈ 9 |
| ඉ. | කාර්ය සාදක වාර්ථාව | ඉ 1 - ඉ 7 |
| ඊ. | මධ්‍යකාලීන සැලැස්ම | ඊ 1 |
| උ. | විගනකාධිපති වාර්තාවෙහි නිරීක්ෂණ සමතයකට පත් කිරීම | උ 1 - උ 4 |

## වගු සටහන


| | | පිටු අංක |
|---|---|---|
| වගුව - 1 | පාඨමාලා අංක 6 හදාරන ලද ශිෂ්‍ය නිලධාරි සංඛ්‍යාව | 7 |
| වගුව - 2 | පාඨමාලා අංක 6 හදාරන ලද ශිෂ්‍ය නිලධාරින්ගේ ප්‍රතිඵලය | 7 |
| වගුව - 3 | වාහන සාරාංශය | 36 |
| වගුව - 4 | යුධ හමුදාවට අයත් වාහන විස්තරය | 37 |
| වගුව - 5 | නාවික හමුදාවට අයත් වාහන විස්තරය | 37 |
| වගුව - 6 | ගුවන් හමුදාවට අයත් වාහන විස්තරය | 37 |
| වගුව - 7 | ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් ලබාදී ඇති වාහන විස්තරය | 38 |
| වගුව - 8 | පවරාගෙන ඇති වාහන විස්තරය | 38 |
| වගුව - 9 | ඉංජිනේරු අංශය වෙතින් සිදුකර ඇති ඉදිකිරීම් | 39 |
| වගුව - 10 | වර්ෂය තුළ සිදුකර ඇති යටිතල පහසුකම් පිළිබඳ සංවර්ධනය | 43 |
| වගුව - 11 | අවසන් කිරීමට නියමිත ව්‍යාපෘති | 43 |

# වාර්ෂික වාර්තාව - 2012
# ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය

## ඉතිහාසය

1. ශිෂ්‍ය නිලධාරීන් 26 දෙනෙකුගෙන් සමන්විත යුධ හමුදා අණ සහ මාණ්ඩලික විද්‍යාලය 1998 මාර්තු 16 වනදා ආරම්භ වුවද, විද්‍යාලය නිල වශයෙන් විවෘත කරනු ලැබුයේ එවකට යුධ හමුදාපති ලුතිනන් ජෙනරාල් ආර් ද එස් දලුවත්ත ආර්ඩබ්පී ආර්එස්පී වීඑස්වී යුඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ ආරාධනයෙන් එවකට ජනාධිපතිව සිටි අතිගරු චන්ද්‍රිකා කුමාරතුංග බණ්ඩාරනායක මැතිනිය විසින් 1998 අගෝස්තු මස 28 වන දින වේ.

2. බ්‍රිතාන්‍ය යුධ හමුදා මාණ්ඩලික විදුහලේ බ්‍රිතාන්‍ය ජාතික ලුතිනන් කර්නල් දෙදෙනෙකුගේ උපදේශකත්වයෙන් මාණ්ඩලික විද්‍යාලීය විෂයමාලාව ශ්‍රී ලංකා යුධ හමුදාවේ අවශ්‍යතාවය අනුව පිලියෙල කරන ලදී. යුහ අණ හා මාණ්ඩලික විද්‍යාලයේ ආරම්භයේදී මෙම නිලධාරීන් විසින් පුහුණු ආම්පන්න සැපයීමෙන් හා උපදේශක නිලධාරීන්ගේ උපදේශණ හැකියාවන් ප්‍රගුණ කිරීම මගින් විද්‍යාලයේ සාර්ථකත්වය සඳහා විශේෂ දායකත්වයක් ලබාදෙන ලදී.



3. තෝරාගත් යුධ හමුදා නිලධාරීන්ගේ අණ සහ මාණ්ඩලික රාජකාරීන්හි වෘත්තීය දැනුම හා අවබෝධය වර්ධනය කිරීමෙහි අරමුණින් යුහඅමාවි ආරම්භ කරන ලදී. මීට අමතරව ශ්‍රී ලංකා නාවික හා ගුවන් හමුදා නිලධාරීන් කිහිපදෙනෙකුද මෙම පාඨමාලාවට තෝරා ගත් අතර, ඔවුන්ද යුහඅමාවි පාඨමාලා අංක 1 සිට පාඨමාලාවන් හදාරන ලදී. 1998 සිට 2006 දක්වා විද්‍යාලය විසින් උපාධිධාරී නිලධාරීන් 253 දෙනෙකු බිහිකල අතර, යුධ හමුදා නිලධාරීන් 209 ක්, නාවික හමුදා නිලධාරීන් 22 ක්, ගුවන් හමුදා නිලධාරීන් 21 ක්, සහ පොලිස් නිලධාරීන් 01 අයෙකුද ඊට අයත් වුනි. මෙම සංඛ්‍යාව 1996 වර්ෂය වන විට ශ්‍රීලංකා යුධ හමුදාවේ සිටි මාණ්ඩලික උපාධි පාඨමාලාව හදාරන ලද නිලධාරීන් 58 දෙනාට අමතරව වේ. රටෙහි පැවති ආරක්ෂක තත්වය මත ත්‍රිවිධ හමුදා ඒකාබද්ධ පුහුණුවක අවශ්‍යතාවය දැනී තිබුණු බැවින්, මාණ්ඩලික විද්‍යාලය විසින් ත්‍රිවිධ හමුදාවන් හට ඒකාබද්ධ න්‍යායාත්මකව හා ප්‍රායෝගික අභ්‍යාස ලබාදීම සඳහා පියවර ගන්නා ලදී. තවද, ඒකාබද්ධ යුධ පුහුණු පරිසරයක් ඇති කිරීමෙහිලා යුධ න්‍යාය හා දර්ශනයන් නැවත සංස්කරණය කර අදට ගැලපෙන ඒකාබද්ධ පුහුණු පාඨමාලාවක් සකස් කිරීමට පෙලඹුනි.

4. වර්ෂ 2007 ක් වූ ජනවාරි 22 වන දින, ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවන්ගේ වැදගත් සංධිස්ථානයක් විය. ලෝකයේ වෙනත් රටවල මෙන් ත්‍රිවිධ හමුදාවන්ට න්‍යායාත්මක සහ ප්‍රායෝගික පුහුණුවක් ලබාදීම සඳහා එකම ස්ථානයක් ස්ථාපිත කරනු වස්, මාණ්ඩලික විද්‍යාලය සුවිශේෂ ස්ථානයකට පත්කරන ලදී. අණ හා මාණ්ඩලික විද්‍යාලය නමින් ස්ථාපිත මෙම විද්‍යාලය ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මහතා විසින් නිල වශයෙන් ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය ලෙස (ආසේඅමාවි) ස්ථාපිත කරන ලදී. ඊට සමගාමීව යුධ හමුදා නිලධාරී 36 දෙනෙකුගෙන්ද, නාවික හමුදා නිලධාරීන් 8 දෙනෙක් සහ ගුවන් හමුදා නිලධාරීන් 10 දෙනෙකුගෙන්ද සමන්විත ආසේඅමාවි පළමුවන පාඨමාලාව මෙදින ලියාපදිංචි කර ආරම්භ වන ලදී.







පැරණි ලාංඡනය          නව ලාංඡනය

5. ග්‍රීක ඉතිහාසයේ සඳහන් පරිදි ආතර් රජුගේ පුරාවෘත්තවල පැවත එන පරිදි බස්සා ඥානය පිළිඹිබු කරන පක්ෂියා වශයෙන් හැඳින්වෙන මධ්‍ය යුගයේ එකල විසූ පූජ්‍ය පක්ෂය සහ විද්වතුනගේ දැනුම බුද්ධිය පරිනතභාවය පෙන්වන සලකුණක් වූ බස්සා බුද්ධිමතුන්ගේ ලකුණ විය.

6. රෝම පුරාවෘත්තයන්හි සඳහන් පරිදි යුද්ධය සහ ප්‍රඥාව අධිපති ලෙස මිනර්වා දෙවඟන හඳුන්වයි. ඇගේ ප්‍රියතම පක්ෂියා වී ඇත්තේ බස්සාය. බස්සා ප්‍රඥාවේ සලකුණ ලෙස සලකමින් එම පක්ෂියා විද්‍යාලයේ සලකුණ ලෙස සම්මත කරගෙන ඇත. “සිහිනුවණින් රණ දෙරණට” යන පාඨය පෙරටුකර ගෙන යුධ නාවුක හා ගුවන් හමුදා නියෝජනය කිරීම සඳහා තැඹිලි පාට වර්ණ පසුතලයක කඩු දෙකකින් ද තද නිල් පාට පසුබිමක නැංගුරමකින්ද ලා නිල් පාට පසුබිමක ඇල්බට්‍රොස් පක්ෂියාගෙන්ද බස්සා මධ්‍යයෙන් සිට ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විදුහලේ නිල ලාංජනය පිළියෙල වී ඇත.

## දැක්ම

7. තෝරාගත් ත්‍රිවිධ හමුදා නිලධාරින් සහ රාජ්‍ය ආයතන වල නිලධාරින්ගේ අවබෝධය දියුණු කිරීම හා යුධ හමුදා නිලධාරින් මේජර්/ලුතිතන් කර්නල් නිලයේ තනතුරු සඳහාත්. නාවික හමුදා නිලධාරින් ලුතිතන් කමාන්ඩර්/කමාන්ඩර් තනතුරු සඳහාත්, ගුවන් හමුදා නිලධාරින් බලඝණ නායක/වින්ග් කමාන්ඩර් තනතුරු සඳහාත්ල වෙනත් රාජ්‍ය ආයතන වල නිලධාරින් ඔවුන්ට උචිත මාණ්ඩලික තනතුරු හා පොලිස් නිලධාරින් තම ආයතන වල අණ හා මාණ්ඩලික තනතුරු සඳහා පුහුණු කිරීම විදුහලේ දැක්ම වේ.

**<u>මෙහෙවර</u>**

8. ත්‍රිවිධ හමුදාවෙන් තෝරාගත් නිලධාරින් හට මාණ්ඩලික නිලධාරි දෙවන ශ්‍රේණියේ හා ඊට ඉහල තනතුරුවල රාජකාරින් සාර්ථකව ඉටුකිරීම් වස් අවශ්‍ය දැනුම ලබාදීමටත් ඔවුන් තුල පෞද්ගලික හා වෘත්තීමය සදාචාරාත්මක සංවර්ධනයක් ඇති කිරිමටත් අණ සහ මාණ්ඩලික පත්වීම්වල ඵලදායි ලෙස කටයුතු කිරිම සඳහා හැකියාව ලබාදීමත් මෙහෙවර වේ.

9. මෙහෙවර ප්‍රකාශයට අනුව විෂය නිර්දේශය ව්‍යුහාත්මක සංවර්ධනය වෙමින් විද්‍යාලයට කාලීනව ගැලපෙන පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කරයි. මේ සඳහා පහත කරුණු විශේෂ සැලකිල්ලට භාජනය වේ.

අ. බුද්ධිමය සංවර්ධනය සඳහා අධ්‍යාපනය හා අවශ්‍ය කුසලතාවයන් ලබාදීම.
ආ. පුද්ගල හා වෘත්තීය සදාචාරය හා හැකියාවන් සංවර්ධනය කිරිම.

**<u>අරමුණු</u>**

10. මූලික අරමුණු පහත සඳහන් පරිදි වේ.

අ. යුධ හා සාමකාමී යන අවස්ථාවන් දෙකෙහිදීම ඒ සඳහා ක්‍රියාකල යුතු ආකාරය හා ඊට අදාල ශිල්පීය ක්‍රම පිළිබඳව දැනුවත් වී සිටීම.

ආ. ඕනෑම අන්දමක යුධමය මෙහෙයුමකදී හමුදාවක අන්තර්ගත වී ඇති යුධ මූලධර්ම හා ශිල්පීය ක්‍රම පිළිබඳ දැනුවත් වීම හා ඒ තුලින් ඒකාබද්ධව හෝ තනිව ක්‍රියා කිරිම.

ඇ. යුධ හමුදා සේනාංකයක හෝ නාවික හා ගුවන් හමුදාවල ඊට සමාන මට්ටමේ අණදීමේ යාන්ත්‍රණයේ ක්‍රියාකාරකම් පිළිබඳ විග්‍රහය.

ඈ. ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදාවන්හි ව්‍යුහය, සංවර්ධනය භූමිකාව සහ අන්තර් යැපීම පිළිබඳව දැනුවත් වීම.

ඉ. ශ්‍රී ලංකාවේ ආරක්ෂක ප්‍රතිපත්තිය සකස් වී ඇති ආකාරය සහ යුධ හමුදා දර්ශනය ඊට සම්බන්ධ වී ඇති අයුරු අවබෝධ කර ගැනීම.

ඊ. ශ්‍රී ලංකාවේ හා මිත්‍ර රටවල ආරක්ෂක ප්‍රතිපත්ති වලට බලපෑම් ඇති කරනු ලබන ජාතික හා ජාත්‍යන්තර කරුණු පිළිබඳව විග්‍රහය.

## මාණ්ඩලික විද්‍යාලයේ ක්‍රියාකාරකම් හා සංවිධාන ව්‍යුහය

11. **සංවිධානය**. ආසේඅමාවි සංවිධාන ව්‍යුහය - MOD/CSCB/4/(75) 24 February දරණ ලිපිය යටතේ කළමණාකරණ සමිතිය මගින් අනුමත කර ඇත.



12. **ක්‍රියාකාරිත්වය.** මාණ්ඩලික විදුහලේ අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා එයට පැවරී ඇති කාර්යභාරය පහත පරිදි වේ.

අ. සන්නද්ධ හමුදා වල නිලධාරීන් මාණ්ඩලික විද්‍යාලයේ අධ්‍යාපන පාඨමාලාව සඳහා බඳවා ගැනීම.

ආ. පොලිස් දෙපාර්තමේන්තුව හෝ ශ්‍රී ලංකාවෙන් පිටත හමුදාමය සංවිධාන වල සාමාජිකයින් විද්‍යාලීය පාඨමාලාව හැදෑරීම සඳහා ඇතුලත් කර ගැනීම.

ඇ. විද්‍යාලයේ අධ්‍යන මණ්ඩලය තීරණය කරන පරිදි ආරක්ෂාව සහ යුධ කළමණාකරණය පිළිබඳව හැදෑරීම සඳහා රාජ්‍ය නිලධාරීන් හට මුදල් ගෙවා පාඨමාලා හැදෑරීමට අවස්ථාව ලබා දීම .

ඈ. ඉහත 'අ' 'ආ' සහ 'ඇ' ඡේද වල සඳහන් පරිදි එම නිලධාරීන් ලබාගත් කුසලතාවය සහ ප්‍රවීනතාවය ඇගයීම සඳහා විභාග පැවැත්වීම.

13. **කළමණාකරණ මණ්ඩලය.** මාණ්ඩලික විද්‍යාලයේ කළමණාකරණ සහ පරිපාලන කටයුතු සඳහා පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත කළමණාකරණ මණ්ඩලයට බලය පැවරී ඇති අතර, එම මණ්ඩලය රාජ්‍ය ආරක්ෂක අමාත්‍යතුමා විසින් පත්කර ඇත.

අ. ආරක්ෂක ලේකම් - සභාපති.

ආ. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි.

ඇ. යුධ හමුදාපති.

ඈ. නාවික හමුදාපති.

ඉ. ගුවන් හමුදාපති.

ඊ. අතිරේක ලේකම් (ආරක්ෂක).

උ. කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ උපකුලපති.

ඌ. භාණ්ඩාගාර ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයෙකු.

එ. මාණ්ඩලික විද්‍යාලයේ සේනාවිධායක.

ඒ. ආසේඅමාවි බ්‍රිගේඩියර් සම්බන්ධීකරණ (ලේකම්).

14. කළමණාකරණ මණ්ඩල රැස්වීම විද්‍යාලයේ පාඨමාලා පුහුණුව ඉහළ නැංවීම සඳහා මෙන්ම විදුහලේ යටිතල පහසුකම් නැංවීම සඳහා 2012 වර්ෂයේ අටවරක් පවත්වනු ලැබිය.

15. **විද්‍යාලීය අධ්‍යන මණ්ඩලය.** විද්‍යාලයේ අධ්‍යන කටයුතු සහ ආරක්ෂක අධ්‍යාපන කටයුතු සම්බන්ධව ක්‍රියා කිරීම සඳහා පහත සඳහන් අධ්‍යන මණ්ඩලය පත්කර ඇත.

අ. ආසේඅමාවි සේනාවිධායක.

ආ. කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ උපකුලපති තුමාගේ නියෝජිතයකු.

ඇ. ආසේඅමාවි බ්‍රිගේඩියර් සම්බන්ධීකරණ.

ඈ. යුධ හමුදා ප්‍රධාන උපදේශක.

ඉ. නාවික හමුදාවේ ප්‍රධාන උපදේශක.

ඊ. ගුවන් හමුදාවේ ප්‍රධාන උපදේශක.

උ. ආසේඅමාවි ප්‍රධාන මාණ්ඩලික නිලධාරී 1 - ලේකම්.

16. **විද්‍යාලීය ගිණුම් හා කළමනාකරණ මණ්ඩලය.** විද්‍යාලයේ ගිණුම් හා මූල්‍යමය කළමණාකරණ කටයුතු සම්බන්ධව ක්‍රියා කිරීම සඳහා පහත සඳහන් මණ්ඩලය පත්කර ඇත.

අ. අතිරේක ලේකම් (සංවර්ධන) - ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය..

ආ. ආසේඅමාවි සේනාවිධායක.

ඇ. අතිරේක අධ්‍යක්ෂක ජෙනරල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තුමේන්තුව.
ඈ. විගණන අධිකාරී - විගණකාධිපති දෙපාර්තුමේන්තුව
ඉ. ආසේඅමාවි බ්‍රිගේඩියර් සම්බන්ධීකරණ.
ඊ. ආසේඅමාවි බ්‍රිගේඩියර් පාලන හා හකාස.
උ. ප්‍රධාන ගණකාධිකාරී - ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යංශය.
ඌ. අභ්‍යන්තර ගිණුම් පරීක්ෂක - ආසේඅමාවි.
එ. ගණකාධිකාරී - ආසේඅමාවි

**<u>විෂය නිර්දේශය</u>**

17. පාඨමාලාව සති **3** ක ආරම්භක සැසිවාරයකින්ද, අධ්‍යාපන කාර්තු 4 කින්ද සමන්විත වේ.

18. <u>පළමුවන වාරය - මූලික අධ්‍යනය (සති11)</u> . මෙය 2012 ජනවාරි 23 දින ආරම්භකරන ලද අතර 2012 අප්‍රේල් 7 දින නිමවුනි. පහත විෂයන් මෙම කාර්තුව තුළ ආවරණය විය.

අ. හමුදාවන් හි විවිධ අංශ.
ආ. සංග්‍රාමික සේවා ආධාර.
ඇ. අණ දීම, අණ දීමේ සහය සහ තීරණ ගැනීම.
ඈ. දර්ශනය, ක්‍රියාන්විත හා සටන් කටයුතු .
ඉ. බුද්ධිමය මාණ්ඩලික රාජකාරි.
ඊ. ප්‍රධාන හා හඨ කාර්ය සම්පාදන මාණ්ඩලික රාජකාරි.
උ. හට කාර්ය සම්පාදන මාණ්ඩලික රාජකාරි.
ඌ. යුධ ක්‍රියාන්විතයන්.
එ. පර්යේෂණ ක්‍රමවේදයන්.
ඒ. ශ්‍රී ලාංකීය අධ්‍යාපනය.

19. <u>**දෙවන වාරය - යුධ ක්‍රියාන්විතයන් (සති 13)**</u>. මෙය 2012 අප්‍රේල් 16 සිට 2012 ජුලි 12 දක්වා පැවැත්වෙන ආවරණය වූ විෂය කොටස් මෙසේය.

අ. ගුවන් සටන් ක්‍රම.
ආ. සිවිල් අධිකාරීන් වෙත හමුදා ආධාර.
ඇ. යුධ ක්‍රියාන්විතයන්.
ඈ. උපක්‍රමික අධ්‍යන.
ඉ. ජාත්‍යන්තර සම්බන්ධතා.
ඊ. විදේශ අධ්‍යාපන චාරිකාව.

20. <u>**තුන්වන වාරය- යුධ කටයුතුවලට අමතර ක්‍රියාන්විත (සති 12)**</u>. මෙම පාඨමාලාව 2012 ජුලි 17 සිට 2012 ඔක්තෝබර් 14 දක්වා පැවැත් විය. පහත විෂය කොටස් මේ යටතේ ආවරණය විය.

අ. ප්‍රති ත්‍රස්තවාදි ක්‍රියාන්විත මෙහෙයුම්.
ආ. කළමණාකරණය.
ඇ. නාවික සටන් ක්‍රම.
ඈ. උපක්‍රමික අධ්‍යන.
ඉ. ජාත්‍යන්තර සම්බන්ධතා.
ඊ. ජාත්‍යන්තර මානව නීතිය පිළිබඳව වැඩ මුළුව.
උ. ඒකාබද්ධ මෙහෙයුම.

21. <u>හතරවන වාරය - කලමණාකරණය හා තාක්ෂණය (සති 7)</u> මෙම කාර්තුව 2012 ඔක්තෝබර් 30 සිට 2012 දෙසැම්බර් 14 දක්වා පැවැත්විය. පහත විෂයන් මෙහිදී ආවරණය කෙරුණි.

- අ. කලමණාකරණය.
- ආ. යුධ තාක්ෂණය.
- ඇ. එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම්.
- ඈ. ක්‍රියාන්විත සඳහා පුහුණු වීම්.
- ඉ. ආරක්ෂාව.
- ඊ. පරිපාලනය.
- උ. න්‍යෂ්ඨික, ජීව විද්‍යාත්මක හා රසායන යුධ කටයුතු.

## <u>ආසේඅමාවි පාඨමාලා 6 පුහුණු ක්‍රියාකාරකම්</u>

22. ආසේඅමාවි පාඨමාලාව හැදෑරූ ශිෂ්‍ය නිලධාරින් සංඛ්‍යාව පහත පරිදි වේ.

| යුධහමුදා | නාවික | ගුවන් | විදෙස් | මුළු බලකාය |
|---|---|---|---|---|
| 55 | 19 | 17 | 11 | 102 |

**වගුව - 1**

23. පාඨමාලාව හැදෑරූ විදෙශ් ශිෂ්‍ය නිලධාරින් පහත පරිදි වේ.

- අ. බංගලාදේශය - 1
- ආ. චීනය - 2
- ඇ. ඉන්දියාව - 2
- ඈ. ඉන්දුනිසියාව - 1
- ඉ. මැලේසියාව - 1
- ඊ. මාළදිවයින - 1
- උ. නේපාලය - 1
- එ. පකිස්ථානය - 1
- ඒ. සුඩානය - 1

24. <u>ප්‍රතිඵල</u>. 2012 ජනවාරි 24 දින පවත්වනු ලැබූ 24 වන කලමණාකාර රුස්වීමේදි අනුමත කර ආසේඅමාවි පාඨමාලා අංක 6 ට අදාළ ප්‍රතිඵල නිකුත් කෙරුණි. එහි සාරංශය පහත පරිදි වේ.

| හමුදා අංශය | අවසාන කාර්තුවේදි සිටි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | ලබා ගත් | පාඨමාලාව හැදෑරූ වර්ෂය | තම ඒකකය වෙත හරවා යැවූ විනය නීති | MDS ආරක්ෂක සේවා පිළිබඳ පශ්වාත් උපාධිය ලබා ගත් |
|---|---|---|---|---|---|
| **(a)** | **(b)** | **(c)** | **(d)** | **(e)** | **(f)** |
| යුධහමුදාව | 64 | 64 | - | - | 30 |
| නාවිකහමුදාව | 20 | 20 | - | - | 9 |
| ගුවන්හමුදාව | 18 | 18 | - | - | 13 |
| **එකතුව** | **102** | **102** | - | - | **52** |

**වගුව -2**

**25**. ආසේඅමාවි පාඨමාලාව 6 අනුමත අධ්‍යන විෂය නිර්දේශය අනුව මෙහෙයවන ලදි. පාඨමාලාව මෙහෙයවීම, මෙහෙයවීම නිලධාරින් හා සුදුසුකම් ලත් කථිකාචාර්යවරුන් සතර දෙනෙකු විසින් ආරක්ෂක සේවා පිලිබඳ පශ්චාත් උපාධි පාඨමාලාවට අදාලව පවත්වන ලදි. මීට අමතරව ශිෂ්‍ය නිලධාරින්ගේ දැනුමේ තිම්වලලු පුළුල් කරනු වස් ඔවුන්ව විවිධ වැදගත් රාජ්‍ය හා පෞද්ගලික ආයතන වෙතද, විදෙස් සංචාර සඳහාද, සහභාගි කරවන ලදි. මෙම ක්‍රියාකාරකම් ශිෂ්‍ය නිලධාරින්ගේ උපක්‍රමික හා තාක්ෂණික ඥානය හා සැබෑදි ආරක්ෂක ක්‍රියාන්විතයන්හිදි ඉංජිංනේරු ආධාර සැළසුම්කරණය, සේනාංකය/බලසේනාආවරණය විය.

**26**. ආසේඅමාවි පාඨමාලා 6 අධ්‍යයන වාර 4කින් යුක්ත වූ අතර, පහත සඳහන් පුහුණු ක්‍රියාකාරකම් වලින් සමන්විත වන ලදි.

අ. <u>පළවන වාරයේදී පවත්වන ලද අභ්‍යාස</u>.

(1) <u>**යුධ හමුදා අංශය**</u>

(අ) **'<u>තන්ඩර් බෝල්ට්'</u> අභ්‍යාසය.** මෙම අභ්‍යාසය 2012 ජනවාරි මස **25** වන දින විද්‍යාල භූමියේදි පවත්වන ලද අතර, ප්‍රහාරයකදි වෙඩි බලය සැලසුම්කරණය පිළිබඳ අවබෝධය ලබාදෙන ලදි.



(ආ) **'<u>හෝල්ඩ් ෆාස්ට්'</u> අභ්‍යාසය.** මෙම අභ්‍යාසය 2012 ජනවාරි 30 දින යුධ හමුදා ශිෂ්‍ය නිලධාරින් විසින් විද්‍යාල පරිශ්‍රයේදි පවත්වන ලද අතර, මෙහි අරමුණ වූයේ ආරක්ෂක ක්‍රියාන්විතයන්හිදි ඉංජිනේරු ආධාර, සේනාංකය/බලසේනා මට්ටමින් සැලසුම්කරණය පිළිබඳ අවබෝධයක් ලබා දීමයි.



(ඇ) **'පැන්ඩෝරා බොක්ස්' අභ්‍යාසය.** මෙම අභ්‍යාසය 2012 පෙබරවාරි 3 වන දින යුධ හමුදා ශිෂ්‍ය නිලධාරින් විසින් විද්‍යාල පරිශ්‍රයේදි පවත්වන ලදි. සංක්ෂිප්ත වාර්ථාවක් පිළියෙල කිරීම මෙම අභ්‍යාසයේ අරමුණ වේ.



(ඈ) **'මාස්ටර් රයිටර්' අභ්‍යාසය.** මෙම අභ්‍යාසය 2012 පෙබරවාරි 22 දින යුධ හමුදා ශිෂ්‍ය නිලධාරින්ගේ සහභාගිත්වයෙන් පවත්වන ලද අතර, එමගින් රාජකාරි සේවා ලිපි ලිවීම සැබැඳිව ඇති නීති පිළිබඳ නිවැරදි හා මනා පුහුණුවක් ලබාදෙන ලදි.



(ඉ) **'කැරවෑන්' අභ්‍යාසය.** මෙම අභ්‍යාසය 2012 මාර්තු 5 වන දින යුධ හමුදා ශිෂ්‍ය නිලධාරින් විසින් විද්‍යාල පරිශ්‍රයේදි පවත්වන ලද අතර, එමගින් ශිෂ්‍ය නිලධාරින්ට උපක්‍රමශීලිව ක්‍රියාත්විතයන්ට පෙර මාර්ග සංචාරය සම්බන්ධ මාණ්ඩලික පුහුණුවක් හා සැලසුම්කරණ දැනුම ලබාදිම අරමුණ විය.



(ඊ) **'බ්‍රාස් ටැක්' අභ්‍යාසය.** මෙම අභ්‍යාසය ගම්පහ අස්ගිරි රජමහා විහාර ප්‍රදේශයෙදි 2012 මාර්තු මස 27 දින පවත්වන ලදි. සේනාංක/බලසේනා සංකල්පය මත සිට ආරක්ෂාව පිළිබඳ සැලසුම්කරණය පිළිබඳ පුහුණු ලබාදිම අරමුණ විය.



(2) <u>නාවික හමුදා අංශය</u>

(අ) **'<u>ලෙප්ට් හුක්' අභ්‍යාසය</u>.** මෙම අභ්‍යාසය 2012 පෙබරවාරි මස 3 වන දින නාවික හමුදා ශිෂ්‍ය නිලධාරින් වෙනුවෙන් විද්‍යාල පරිශ්‍රයේදී පවත්වන ලද අතර, අරමුණ වූයේ දීර්ඝ අවිධිමත්ව ලියන ලද ලිපි වලින් එම විෂය පිළිබඳ ප්‍රධාන කරුණු උකහා ගනිමින් සංවිධානාත්මකව සාරාංශ ගත කිරීමේ හැකියාව සංවර්ධනය කිරීමයි.



(ආ) **'<u>වර්බල් ඩී' අභ්‍යාසය</u>.** මෙම අභ්‍යාසය 2012 පෙබරවාරි මස 15 වන දින විද්‍යාල භූමියේදී නාවික හමුදා නිලධාරින් විසින් පවත්වන ලදී. මෙහිදී ශිෂ්‍ය නිලධාරින්ට පෙර පුහුණු නොවූ කථා පැවැත්වීමේ අභ්‍යාසය සිදු කරන ලදී. පෙර පුහුණු නොවූ කථා, එම මොහොතේ පැවැත්වීම තුළින් ඔවුන්ට තමන්ගේ මතකයන් හා විෂය දැනුම සභාවක පැහැදිලිව ඉදිරිපත් කිරීමේ කුසලතාවය වර්ධනය කෙරේ.



(ඇ) **'<u>ස්මෝක් ස්ටැක්' අභ්‍යාසය</u>.** මෙය 2012 මැයි මස 14 දින ශිෂ්‍ය නිලධාරින් වෙනුවෙන් විද්‍යාල පරිශ්‍රයේදී පවත්වන ලදී. මෙහිදී සංකීර්ණ තත්වයන් සඳහා රූපමය ක්‍රියාදාමයන් ඔස්සේ විසඳුම් සෙවීමට යොමුකරන ලදී.



(3) <u>ගුවන් හමුදා අංශය</u>

(අ) <u>'විද්වත් කථා' අභ්‍යාසය</u>. මෙය 2012 පෙබරවාරි මස 15 දින ගුවන් හමුදා ශිෂ්‍ය නිලධාරින් වෙනුවෙන් විද්‍යාල භූමියේදී පවත්වන ලද්දේ ඔවුන් හට ලියවිල්ලක් නිවැරදිව සැකසීමකින් යුක්තව ඉදිරිපත් කිරීමේ හැකියාව වර්ධනය කරනු පිණිසය.



(ආ) <u>'ගුවන් ප්‍රහාර' අභ්‍යාසය</u>. මෙය 2012 මාර්තු මස 26 වන දින සිට මාර්තු මස 27 දක්වා ගුවන් හමුදා ශිෂ්‍ය නිලධාරින් උදෙසා විද්‍යාල පරිශ්‍රයේදී පවත්වන ලද්දේ තනි පුද්ගල අභ්‍යාස පුහුණු කිරීමේ අභිප්‍රාය ඇතිවය.



(4) <u>ත්‍රිවිධ හමුදා ඒකාබද්ධ අභ්‍යාසය.</u>

(අ) <u>'රවුන්ඩ් ටේබල්' අභ්‍යාසය.</u> මෙය 2012 මාර්තු මස 12 දින සියළු ශිෂ්‍ය නිලධාරින් උදෙසා විද්‍යාල පරිශ්‍රයේදී පැවැත්විණි. සාකච්ඡා සටහන් ලිවීමේ කුසලතාවය වර්ධන කිරීම අරමුණ විය.



අ. <u>දෙවන වාරයේ පවත්වන ලද අභ්‍යාස</u>.

(1) <u>යුධ හමුදා අංශය</u>.

(අ) **‘<u>අපර් කට්</u>’ අභ්‍යාසය.** මෙම අභ්‍යාසය 2012 මැයි 8 දින සිට 14 දින දක්වා යුධ හමුදා ශිෂ්‍ය නිලධාරින් වෙනුවෙන් නාරම්මල ප්‍රදේශයේ පැවැත්විණි. එහි අරමුණ වුයේ බලසේනා මට්ටමින් ප්‍රහාරාත්මක ක්‍රියාන්විත සැලසුම් පුහුණු කිරිම වේ.



(ආ) **‘<u>ෂයිනින් ආමර්</u>’ අභ්‍යාසය.** මෙම අභ්‍යාසය 2012 මැයි මස 28 දින විද්‍යාල පරිශ්‍රයේදි යුධ හමුදා ශිෂ්‍ය නිලධාරින් වෙනුවෙන් පවත්වන ලදි. අරමුණ වුයේ ක්‍රියාන්විත නියෝග සැබැදි අභ්‍යාස කිරිමය.



(ඇ) **‘<u>කැරියර් පිජන්</u>’ අභ්‍යාසය**. මෙම අභ්‍යාසය 2012 ජුලි මස 2 සිට 8 වන දින දක්වා විද්‍යාල භුමියේදි හමුදා ශිෂ්‍ය නිලධාරින් උදෙසා පවත්වන ලදි. මෙහි අරමුණ වුයේ යුධ න්‍යාය තුල සේනාංක මට්ටමේ ප්‍රහාරාත්මක හා ආරක්ෂාකාරි මෙහෙයුම් සමගින් උපක්‍රමික යුධ ක්‍රියා පිළිබඳ දැනුමක් ලබා දීමයි.



(2) <u>නාවික අංශය</u>.

(අ) **<u>'කිලර් වේල්' අභ්‍යාසය</u>.** මෙම අභ්‍යාසය 2012 ජුනි මස 19 වන දින විද්‍යාල පරිශ්‍රයේදී නාවික හමුදා ශිෂ්‍ය නිලධාරින් විසින් පවත්වන ලදි. මෙහි අරමුණ වූයේ නියත තීරණ හා නිර්දේශ ගනු පිණිස කරුණු මත ඉදිරිපත් කිරීම හා කරුණු ගොනු කිරීමේ කුසලතා ශිෂ්‍ය නිලධාරින් තුළ ඇති කිරීමයි.

.



(ආ) **<u>'කොන්ටිකි' අභ්‍යාසය</u>.** මෙය 2012 ජුනි මස 25 දින සිට 27 දින දක්වා නාවික හමුදා ශිෂ්‍ය නිලධාරින් වෙනුවෙන් අවිස්සාවේල්ල හා හංවැල්ල ප්‍රදේශයේදී පැවැත්වුනි. මෙම අභ්‍යාසය පැවැත්වූයේ ශිෂ්‍ය නිලධාරින් තුළ නායකත්ව කුසලතා, නිර්මාණශීලිත්වය හා වෘත්තීය නිපුණතාවය ඇති කරනු වස් අභියෝගාත්මක ක්‍රියාකාරකම් සැළසුම් කිරීමේ වටපිටාවක ඔවුන්ගේ ආත්ම ශක්තිය ඉහළ නැංවීමේ අභිප්‍රායෙනි.



(ඇ) **<u>'යුලයිසිස්' අභ්‍යාසය</u>.** මෙය 2012 ජුලි මස 2 දින වන දින නාවික හමුදා ශිෂ්‍ය නිලධාරින් වෙනුවෙන් විද්‍යාල පරිශ්‍රයේදී පැවැත් වූ අතර, එහි අරමුණ වූයේ ක්‍රියාන්විත සැළසුම් ක්‍රියාදාමයේදී තාරකිකත්වයේ වැදගත්කම පිලිබඳ ඔවුන් වෙත අවධාරණය කිරීමයි.



(ඇ) **'<u>තන්ඩර් ස්ට්‍රයික්' අභ්‍යාසය</u>.** මෙම අභ්‍යාසය 2012 ජූලි මස 4 දින නාවික හමුදා ශිෂ්‍ය නිලධාරින් සඳහා විද්‍යාල පරිශ්‍රයේදී පැවතුන අතර, එහි අරමුණ වූයේ ශිෂ්‍ය නිලධාරින්ගේ සාහිත්‍ය පරිශීලනය තුලින් පර්යේෂණ හැකියාව වර්ධනය, න්‍යායාත්මක දැනුම ග්‍රහණය හා විවිධ අවස්ථාවලට අනුක්‍රමිකව ක්‍රියාවට නැංවීමේ හැකියාවන් ඔප්නැංවීමයි.



## (3) <u>ඒකාබද්ධ අභ්‍යාසයන්</u>.

(අ) **'<u>ඔක්ටොපස්' අභ්‍යාසය</u>.** මෙය 2012 මැයි මස 10 සිට 11 වන දින දක්වා නාවික හා ගුවන් හමුදා ශිෂ්‍ය නිලධාරින් වෙනුවෙන් විද්‍යාල පරිශ්‍රයේදී පවත්වන ලදි. අරමුණ වූයේ ජලජ ක්‍රියාවට හා ගුවන් ක්‍රියාන්විතයන් සැලසුම්කරණය හා ක්‍රියාවට නැංවිම පිලිබඳ අභ්‍යාසයන් ලබාදිමයි.



(ආ) **'<u>කොන්ක්‍රිට් ජන්ගල්' අභ්‍යාසය</u>.** මෙය 2012 මැයි මස 18 දින සිට 25 දින දක්වා යුධ හමුදා හා ගුවන් හමුදා ශිෂ්‍ය නිලධාරීන් වෙනුවෙන් කුරුණෑගල ඇතුගල ප්‍රදේශයේදී පවත්වන ලදී. අරමුණ වූයේ ප්‍රහාරක හා ආරක්ෂාකාරී මෙහෙයුම් බලසේනා මට්ටමින් නාගරික පරිසරයකදී සැලසුම්කරණය පිලිබද අවබෝධය ලබා දීමයි.



(ඇ) **<u>'ගෝල්ඩන් ශිල්ඩ්' අභ්‍යාසය.</u>** මෙය 2012 මැයි මස 28 දින සිට 2012 ජුනි මස 6 දක්වා ත්‍රිවිධ හමුදා නිලධාරීන් වෙනුවෙන් ගලේවල දඹුල්ල හා නාවුල ප්‍රදේශයන්හිදි පවත්වන ලදී. අරමුණ වූයේ සේනාංක හා බලසේනා මට්ටමේ ආරක්ෂාකාරි මෙහෙයුම් වලදී තීරණ ගැනීමේ හැකියාව සහ ගුවන් බලය යෙදවීම පිළිබඳ පුහුණුවක් ශිෂ්‍ය නිලධාරීන්ට ලබා දීමය.



(ඈ) **<u>'ෂැඩෝ ඩාන්ස්' අභ්‍යාසය.</u>** මෙය 2012 ජුනි මස 20 දින සිට 2012 ජුනි මස 28 දින දක්වා යුධ හමුදා හා ගුවන් හමුදා නිලධාරීන් වෙනුවෙන් විද්‍යාලීය භූමියේදි පවත්වන ලදී. මෙහි අරමුණු වූයේ යුධ සැළසුම් පරීක්ෂා කිරීමේ ක්‍රම වේදයක් (War Game) මගින් සැළසුම් තහවුරු කර ගැනීම සහ සේනාංක මට්ටමේ ඒකාබද්ධ මෙහෙයුම් සැළසුම් කිරීම පුහුණු කිරීමයි.



ඇ. <u>තුන්වන වාරයේ පවත් වන ලද අභ්‍යාස</u>.

(1) <u>යුධ හමුදා අංශය</u>.

(අ) **<u>'පිල් බොක්ස්' අභ්‍යාසය.</u>** යුධ හමුදා නිලධාරීන් වෙනුවෙන් 2012 අගෝස්තු මස 6 දින සිට 7 දින දක්වා විද්‍යාලීය පරිශ්‍රයේදී පැවැත්විණි. මෙහි අරමුණ වූයේ ආරක්ෂක මෙහෙයුම් වලදී බලසේනා මට්ටමේ ප්‍රති ත්‍රස්තවාදි ආරක්ෂක සැළසුම් සකස් කිරීමයි.



(ආ) **‘ඉන්ක් බෝල්ට්’ අභ්‍යාසය.** 2012 සැප්තැම්බර් මස 2 සිට 2012 සැප්තැම්බර 6 දින දක්වා දින දක්වා යුධ හමුදා ශිෂ්‍ය නිලධාරින් වෙනුවෙන් විද්‍යාල භූමියේදී පවත්වන ලදී. මෙහි අරමුණ වූයේ සේනාංකයක මට්ටමේ ප්‍රති ත්‍රස්ථවාදි ක්‍රියාන්විත සඳහා හය පිරිස් යෙදවීමේ සැලසුම් කිරීම පිළිබඳ අවබෝධයක් ලබා දීම.



(2) <u>නාවික හමුදා අංශය</u>.

(අ) **‘ට්‍රයිඩන්ට්’ අභ්‍යාසය.** මෙය 2012 සැප්තැම්බර් මස 3 දින සිට 6 වන දින දක්වා නාවික හමුදා ශිෂ්‍ය නිලධාරින් වෙනුවෙන් විද්‍යාල භූමියේදී පවත්වන ලදි. මෙහි අභිප්‍රාය වූයේ ක්‍රියාන්විත සැලැස්ම පිළිබඳ පුහුණුවක් ලබාදීමයි.



(ආ) **‘කොනොප්ස්’ අභ්‍යාසය.** 2012 ඔක්තොම්බර් මස 3 සිට 4 දින දක්වා නාවික ශිෂ්‍ය නිලධාරින් සඳහා මෙම අභ්‍යාසය විද්‍යාල පරිශ්‍රය තුල පවත්වන ලදි. යුධ මූලධර්ම සැලකිල්ලට ගෙන ක්‍රියාන්විතයක් අධ්‍යනය කර එමගින් උගත් පාඩම් පිළිබඳව විශ්ලේෂණය කිරීම මෙමගින් බලාපොරොත්තු වේ.



(ඇ) **'සී ලයන්' අභ්‍යාසය.** 2012 නොවැම්බර් මස 20 වන දින විදුහල් පරිශ්‍රයේදී මෙම අභ්‍යාසය පැවැත් වූ අතර, නාවික ක්‍රියාන්විත පිළිවෙත් වල වර්ථමාන හා අනාගත යුධ මෙහෙයුම් හි ප්‍රධාන සංකල්ප ප්‍රතිපත්ති හා ගැටලු පිළිබඳව ඉගැන්වීම මෙමගින් බලාපොරොත්තු වේ.



**(3) ඒකාබද්ධ අභ්‍යාසය.**

(ආ) **ඒකාබද්ධ යුධ සැළසුම් පැකේජය.** ඒකාබද්ධ යුධ සැළසුම් පැකේජය 2012 අගෝස්තු මස 27 සිට 30 දක්වා දින වලදි බංගලාදේශ අණ හා මාන්ඩලික විද්‍යාලයේ ත්‍රිවිධ හමුදා උපදේශකයින් විසින් විදුහලේදි පවත්වන්නට යෙදුනි.



(අ) **'ස්ලෙජ් හැමර්' අභ්‍යාසය.** මෙම අභ්‍යාසය 2012 සැප්තැම්බර් මස 10 සිට 15 දක්වා යුධ හා ගුවන් ශිෂ්‍ය නිලධාරින් විසින් ඒකාබද්ධව විදුහලේදි සිදු කරනු ලැබිය. මෙම අභ්‍යාසය මගින් ක්‍රියාන්විත යුධ සැළසුම් කිරිම හා ක්‍රියාත්මක කිරිමේ පුහුණුව ලබා දෙන අතර, එමගින්

i. ක්‍රියාන්විත/උපක්‍රමික මට්ටමේ ප්‍රතිප්‍රස්තික ක්‍රියා පිළිවෙත් අභ්‍යාසය.
ii. ප්‍රතිප්‍රස්තික ක්‍රියා පිළිවෙත් සඳහා ආරක්ෂිත යුධ සැළසුම් පිළිබඳව අධ්‍යනය.
iii. යුධ අභ්‍යාස ක්‍රීඩා මෙහෙයවිම තුළින් අධ්‍යයනය ලබා දිම සිදු කෙරේ.



(ඇ) **'මැග්නම් ෆෝස්' යුධ අභ්‍යාසය**. මෙය 2012 සැප්තැම්බර් මස 17 සිට 22 දක්වා විදුහල් භූමියේදී පවත්වන ලද අතර, මෙය මාණ්ඩලික යුධ උපක්‍රමික ක්‍රියාදාමයන්හි මාණ්ඩලික නිලධාරියෙකු තිසි තිරණ ගැනීම සහ විවිධ සැලසුම් ක්‍රියාත්මක කිරිම උදෙසා පුහුණුවක් ලබා දිම අරමුණු කරගෙන සිදු කෙරේ.



ඈ. **හතරවන වාරයේදී පවත් වන ලද අභ්‍යාස**.

(1) **යුධ හමුදා අංශය**.

(අ) **'ගයිඩින් ලයිට්' අභ්‍යාසය**. මෙය 2012 නොවැම්බර් මස 20 දින විදුහල් භූමියේදී පවත්වන ලද අතර, යුධ හමුදා පුහුණු ප්‍රතිපත්ති වලට අනුව බලසේනා පුහුණු උපදේශකයෙකු ලෙස



(ආ) **'ගෝස්ට් වෝක්' අභ්‍යාසය**. මෙම අභ්‍යාසය 2012 නොවැම්බර් මස 23 වන දින වැලිවේරිය පුගොඩ සහ කිරදිවැල යන ප්‍රදේශයන්හිදි යුධ හමුදා ශිෂ්‍ය නිලධාරින් විසින් සිදු කරන ලදි. යුධ ක්‍රමෝපායන් පිලිබඳව හට පිරිස් රහිතව ලිඛිතව බල ඇණි මට්ටමින් සිදු කරනු ලබන මෙම අභයාසය යුධ මුලධර්ම මත පිහිටා බල ඇණි මට්ටමින් සිදු කරනු ලබන අභ්‍යාසයකි.



**(2)** **<u>නාවික හමුදා අංශය</u>**.

(අ) **<u>'සලමැන්ඩර්' අභ්‍යාසය</u>**. මෙය 2012 නොවැම්බර් මස 14 වන දින නාවික ශිෂ්‍ය නිලධාරින් විසින් විදුහල් භූමියේදී සිදු කරන ලද අතර, ශිෂ්‍ය නිලධාරින් හට ඒකාබද්ධ යුධ සැලසුම් කිරිම සඳහා පුහුණුවක් ලබාදෙන ලදි.



**(3)** **<u>ගුවන් අංශය</u>**.

(අ) **<u>'දඩු මොණරා' අභ්‍යාසය</u>**. මෙය 2012 නොවැම්බර් මස 23 වන දින නාවික ශිෂ්‍ය නිලධාරින් විසින් විදුහල් භූමියේදී සිදු කරන ලද අතර, මෙම අභ්‍යාසය ගුවන් ශිෂ්‍ය නිලධාරින් විසින් විදුහල් භූමියේදී සිදු කරන ලද අතර, එමගින් තමන් සතු ලේඛණ ගත දැනුම උපයෝගි කරගෙන යුධ ඇගයිමක් තක්සේරුවක් කිරිම සිදු කරයි.



**(4)** **<u>ඒකාබද්ධ අභ්‍යාස</u>**.

(අ) **<u>'කෘෂිබල්' අභ්‍යාසය</u>**. 2012 නොවැම්බර් මස 12 ත්‍රිවිධ හමුදා ශිෂ්‍ය නිලධාරින්ගේ සහභාගිත්වයෙන් විදුහල් භූමියේදී සිදු කරන ලදි. මහජන අවශ්‍යතාවයන් සහ මෙහෙයුම් සඳහා ත්‍රිවිධ හමුදා කැඳවනු ලැබූ විට එම ක්‍රියාවන් සඳහා සැලසුම් කිරිම මෙහෙයුම් ක්‍රියාත්මක කිරිම සඳහා ඒකාබද්ධ පුහුණුවක් ලබා දිම මෙහි අරමුණ වේ.



(ආ) **'පර්පල් ටර්ටල්' අභ්‍යාසය**. මෙම අභයාසය 2012 නොවැම්බර් 15 සිට 19 දක්වා කාලය තුල ත්‍රිවිධ හමුදා ශිෂ්‍ය නිලධාරින්ගේ සහභාගිත්වයෙන් විදුහලේදි පැවැත්විණ. දිය සහ ගොඩ යන උභය මෙහෙයුම් සඳහා පුහුණුවක් ලබාදිම මෙහි අරමුණයි.



ඉ. **රෙඩ් ඉන්ක් කරෙක්ෂන් (1 වාරය) පරික්ෂණ**.

(1) **යුධ හමුදා අංශය**

(අ) 'මාස්ටර් රයිටර්' නැමැති අභ්‍යාසය 2012 පෙබරවාරි 22 දින පවත්වන ලදි.

(ආ) 'රවුන්ඩ් ටේබල්' නැමැති අභ්‍යාසය 2012 මාර්තු මස 12 වන දින පවත්වන ලදි.

(2) **නාවික හමුදා අංශය**

(අ) 'ස්කයිබ්' නැමැති අභ්‍යාසය 2012 පෙබරවාරි 13 දින පවත්වන ලදි.

(ආ) 'රවුන්ඩ් ටේබල්' නැමැති අභ්‍යාසය 2012 මාර්තු 12 දින පවත්වන ලදි.

(3) **ගුවන් හමුදා අංශය**

(අ) 'පෙන් ඩ්‍රයිවර්' නැමැති අභ්‍යාසය 2012 පෙබරවාරි 22 දින පවත්වන ලදි.

(ආ) 'ඇල්බැට්‍රස්' නැමැති අභ්‍යාසය 2012 මාර්තු මස 12 වන දින පවත්වන ලදි.

ඊ. <u>රෙඩ් ඉන්ක් කරෙක්ෂන් (2 වාරය) පරීක්ෂණ</u>

(1) <u>යුධ හමුදා අංශය</u>

(අ) 'අපර් කට්' නැමැති අභ්‍යාසය 2012 මැයි 16 දින පවත්වන ලදි.
(ආ) 'ගෝල්ඩන් ෆීල්ඩ්' නැමැති අභ්‍යාසය 2012 ජූනි මස 6 වන දින පවත්වන ලදි.
(ඇ) 'පැඩෝ ඩාන්ස්' නැමැති අභ්‍යාසය 2012 ජූනි මස 28 වන දින පවත්වන ලදි.

(2) <u>නාවික හමුදා අංශය</u>

(අ) ජාත්‍යන්තර සමුද්‍ර නිතිය විභාගය 2012 අප්‍රේල් මස 19 දින පවත්වන ලදි.
(ආ) 'ස්මෝක්ස්ටැක්' නැමැති අභ්‍යාසය 2012 මැයි මස 14 වන දින පවත්වන ලදි.
(ඇ) 'යුලිසිස්' ක්‍රියාන්විත අභ්‍යාසය 2012 ජූනි මස 20 වන දින පවත්වන ලදි.

(3) <u>ගුවන් හමුදා අංශය</u>

(අ) 'එයාර් ඩිටර්න්ස්' නැමැති අභ්‍යාසය 2012 අප්‍රේල් 19 දින පවත්වන ලදි.
(ආ) 'ගෝල්ඩන් ෆිල්ඩ්' නැමැති අභ්‍යාසය 2012 ජූනි මස 6 වන දින පවත්වන ලදි.

උ. <u>රෙඩ් ඉන්ක් කරෙක්ෂන් (3 වාරය) පරීක්ෂණ</u>

(1) <u>යුධ හමුදා අංශය</u>

(අ) 'ඉන්ක් බ්ලොට්' අභ්‍යාසය 2012 සැප්තැම්බර් මස 6 වන දින පවත්වන ලදි.

(ආ) 'ස්ලෙජ් හැමර්' අභ්‍යාසය 2012 සැප්තැම්බර් මස 15 වන දින පවත්වන ලදි.

(2) <u>නාවික හමුදා අංශය</u>

(අ) 'ට්‍රයිඩන්ට්' නාවික අභ්‍යාසය 2012 සැප්තැම්බර් මස 04 වන දින පවත්වන ලදි.
(ආ) 'ස්ලේඩ්හැමර්' නාවික අභ්‍යාසය 2012 සැප්තැම්බර් මස 15 වන දින පවත්වන ලදි.

(3) <u>ගුවන් හමුදා අංශය</u>

(අ) ස්ලෙජ් හැමර් අභ්‍යාසය 2012 සැප්තැම්බර් මස 15 වන දින පවත්වන ලදි.

ඌ. <u>රෙඩ් ඉන්ක් කරෙක්ෂන් (4 වාරය) පරීක්ෂණ</u>

(1) <u>යුධ නාවික ගුවන් හමුදා අංශ</u>

(අ) සේනාවිධායක පර්යේෂණ කෘති ඉදිරිපත් කිරීම 2012 සැප්තැම්බර් 24 වන දින භාරදීම.

**27.** සියලුම ශිෂ්‍ය නිලධාරීන් සඳහා ආරක්ෂක උපාධි පාඨමාලාවේ අධ්‍යන විෂයන් සඳහා පහත සඳහන් විභාග පවත්වන ලදි.

අ. <u>**දෙවන වාරය**</u>

(1) ශ්‍රීලාංකීය ඉතිහාසය /දේශපාලන/සමාජීය/ආර්ථික සඳහා අධ්‍යන විභාගය 2012 ජූනි මස 15 වන දින පවත්වන ලදි.

ආ. <u>**තුන්වන වාරය**</u>

(1) අන්තර් ජාතික කටයුතු පිළිබඳව විභාගය 2012 ජූලි 24 පවත්වන ලදි.

(2) යුධෝපාය පිළිබඳ අධ්‍යන විභාගය 2012 අගෝස්තු මස 25 පවත්වන ලදි.

ඇ. <u>**හතරවන වාරය**</u>

(1) කළමණාකරණ අධ්‍යන විභාගය 2012 නොවැම්බර් මස 6 පවත්වන ලදි.

**28.** <u>**ඉදිරිපත් කිරීම්**</u>. පාඨමාලා අංක 06 ශිෂ්‍ය නිලධාරීන් විසින් පාඨමාලා කාලය තුළදී පහත සඳහන් මාතෘකා යටතේ ඉදිරිපත් කිරීම් සිදු කරන ලදි.

අ. <u>**1 වන වාරය**</u>.

(1) <u>**අණ හා පාලන අධ්‍යන පිළිබඳව ඉදිරිපත් කිරීම් (යුධ අංශය)**</u>

(අ) ෆීල්ඩ් මාපල් කේ එම් කරියප්පා (ඉන්දියාව)
(ආ) ස්ටුවඩ් ජේම්ස් එවෙල් බ්‍රවුන් (ඇ.එ.ජ)
(ඇ) ෆීල්ඩ් මාපල් ඇලන්බෙ එඩ්මන්ඩ් හෙන්රි හයිමන් (එක්සත් රාජධානිය)
(ඈ) රිජ්වේ මැතිව් බන්කර් (ඇ.එ.ජ)
(ඉ) ජෙනරල් යුලයිසිස් එස් ග්‍රාන්ට් (ඇ.එ.ජ)
(ඊ) මාපල් ජෝර්ජ් කොන්ස්ටන්ටිගොවිඩ් ප්‍රකොම් (රුසියාව)
(උ) ඔලස්ටස් ඉටලි
(ඌ) XIV ලුවිසි
(එ) පීටර් ද ග්‍රේට් (රුසියාව)
(ඒ) ජෝර්ජ් විලියම් කැසි (ඇ.එ.ජ)
(ඔ) හෙරල්ඩ් ඇලේසැන්ඩර් (එක්සත් රාජධානිය)
(ඕ) ඕමාර් බ්‍රැඩ්පි (ඇ.එ.ජ)

(2) <u>අණ හා පාලන අධ්‍යන පිළිබඳව ඉදිරිපත් කිරීම නාවික අංශය (නාවික අංශය)</u>

(අ) අද්මිරල් ඉසෝරොකු යමාමොටෝ
(ආ) අද්මිරල් ඔෆ් ද ප්ලීට් ලුවිස් මවුන්ට්බැටන්
(ඇ) ප්ලීට් අද්මිරල් චෙස්ටර් විලියම් නිමිට්ස්
(ඈ) අද්මිරල් ෆැන්ක් පෙලෙටර්

**(3)** <u>අණ හා පාලන අධ්‍යන පිළිබඳව ඉදිරිපත් කිරීම ගුවන් අංශය (ගුවන් අංශය)</u>

(අ) ජෙනරල් ජේම්ස් හරෝල්ඩ් ඩෝලයිට්
(ආ) මේජර් ජෙනරල් එසර් වයිස්මන්
(ඇ) එයා චීෆ් මාෂල් සර් හග් ඩෝව්ඩින්



ආ. **දෙවන වාරය**

(1) සංග්‍රාම අධ්‍යන ඉදිරිපත් කිරීම යුධ අංශය

(අ) විස්ටුලා මෙහෙයුම
(ආ) ඔකිනාවා සංග්‍රාමය
(ඇ) මොන්ටා කැසිනෝ සංග්‍රාමය
(ඈ) පෝලන්ත ආක්‍රමණය
(ඉ) සිංගපුරු සංග්‍රාමය
(ඊ) ඇරාස් සංග්‍රාමය
(උ) බල්ග් සංග්‍රාමය
(ඌ) ක්‍රේට් අයිලන්ඩ් සංග්‍රාමය
(එ) පිලිපින සංග්‍රාමය
(ඒ) ටැනන්බර්ග් සංග්‍රාමය
(ඔ) සෝම් සංග්‍රාමය
(ඕ) සිසිලියා සංග්‍රාමය

(2) සංග්‍රාම අධ්‍යන ඉදිරිපත් කිරීම (Presentation) නාවික අංශය

(අ) කොරල් මුහුදේ සංග්‍රාමය 1944
(ආ) නැගෙනහිර සොලමන් සංග්‍රාමය 19942
(ඇ) ෆෝල්කන් යුද්ධය 1982
(ඈ) මටපත් තුඩුවේ සංග්‍රාමය 1941

(3) සංග්‍රාම අධ්‍යන ඉදිරිපත් කිරීම (Presentation) ගුවන් අංශය

(අ) ෆෝල්කන් යුද්ධය
(ආ) සික්ස් ඩේ යුද්ධය
(ඇ) පැසිපික් ගුවන් සංග්‍රාමය 2
(ඈ) ගල්ෆ් යුද්ධය 1



ඇ. **<u>3 වන වාරය</u>**

(1) <u>ඓතිහාසික සිද්ධි අධ්‍යන ඉදිරිපත් කිරීම (ඒකාබද්ධ)</u>

(අ) ඒක් සංග්‍රාමය
(ආ) පිලිපීන ජනතා විප්ලවය
(ඇ) ඉරාක සංග්‍රාමය 2003 - 2006
(ඈ) ඇන්ගොලා සිවිල් යුද්ධය
(ඉ) රුවන්ඩා සිවිල් යුද්ධය
(ඊ) ශ්‍රී ලංකා ජනතා විප්ලවය 1987 - 1989
(උ) ඊජිප්තු විප්ලවය 2011
(ඌ) පළමු වන චේචන් කැරැල්ල
(එ) ඉරාන විප්ලවය
(ඒ) නේපාල් විප්ලවය



(2) <u>සංග්‍රාම අධ්‍යන ඉදිරිපත් කිරීම (Presentation) ගුවන් අංශය</u>

(අ) රඩේෂියන් බුෂ් යුද්ධය 1965 - 1973
(ආ) බැරල් රෝල් මෙහෙයුම 1964 -1973
(ඇ) ඇල්ජීරියා යුද්ධය 1954 - 1962
(ඈ) චෙච්නියා යුද්ධය 1994 - 2009



ඈ. **<u>4 වන වාරය</u>**

(1) ශ්‍රී ලංකා ඒකාබද්ධ මෙහෙයුම-සිද්ධි අධ්‍යන ඉදිරිපත් කිරීම (යුද්ධ හමුදා)

(අ) මානුෂික මෙහෙයුම
(ආ) පුදුකුඩුඉරුප්පු සංග්‍රාම
(ඇ) තොප්පිගල අවසන් මෙහෙයුම
(ඈ) පූනරින් සංග්‍රාමය
(ඉ) මුලතිව් කඳවුර වටකිරීම 1996
(ඊ) සත්ජය මෙහෙයුම

(2) ශ්‍රී ලංකා ඒකාබද්ධ මෙහෙයුම-සිද්ධි අධ්‍යන ඉදිරිපත් කිරිම (නාවික හමුදා)

(අ) උතුරු මානුෂික මෙහෙයුමේදි එල්ටීටීඊය මුහුදු කොටි පරාජය කිරිම සඳහා යොදා ගත් යුධෝපාය
(ආ) නැගෙනහිර මානුෂික මෙහෙයුමේදි එල්ටීටීඊය මුහුදු කොටි පරාජය කිරිම සඳහා යොදා ගත් යුධෝපාය

(3) ශ්‍රී ලංකා ඒකාබද්ධ මෙහෙයුම-සිද්ධි අධ්‍යයන ඉදිරිපත් කිරිම (ගුවන් හමුදා)

(අ) මානුෂික මෙහෙයුම එල්ටීටීඊ දෘෂ්ඨි කෝණයෙන්
(ආ) තොප්පිගල අවසන් මෙහෙයුම
(ඇ) පුදුකුඩුඉරුප්පු සංග්‍රාම
(ඈ) මුලතිව් කඳවුර වටකිරිම 1996
(ඉ) පූනරින් සංග්‍රාමය



**29**. **<u>චාරිකා</u>**. වැදගත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන පිළිබඳ ශිෂ්‍ය නිලධාරින්ගේ දැනුම පුලුල් කිරිමේ අරමුණින් විවිධ ආයතන වලට නැරඹීම සහ අධ්‍යයන චාරිකා පිළියෙල කර ඇත මීට අමතරව ඉන්දියාව, ඉන්දුනීසියාව, පාකිස්ථානය සහ මැලේසියාව යන රටවල් වල දින 10 ක විදේශ අධ්‍යන චාරිකා යෙදීමට ශිෂ්‍ය නිලධාරින්ට අවස්ථාව උදා වෙන ලදි.

අ. <u>1 වන වාරය</u>

(2) මිනින්දෝරු දෙපාර්තමේන්තුව චාරිකාව 2012 පෙබරවාරි 2 දින



(3) කොළඹ මහාධිකරණ අධ්‍යන චාරිකාව නාවික ශිෂ්‍ය නිලධාරින් විසින් 2012 අප්‍රේල් 23 වන දින සිදු කරන ලදි.



ආ. **2 වන වාරය**

(1) බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ සහ කටුනායක ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුර 2012 අප්‍රේල් 30 වන දින ශිෂ්‍ය නිලධාරින් විසින් චාරිකාවක යෙදෙන ලදි.



(2) 2012 ජුනි 7 දින සීගිරිය ඓතිහාසික භූමිය අධ්‍යනයක යෙදෙන ලදි.



(3) 2012 ජුනි 18 දින නාරා (NARA) ජාතික ජලජ සම්පත් ගවේෂණ හා සංවර්ධණ ඒජන්සිය සහ කාලගුණ දෙපාර්තමේන්තුව නැරඹීමේ චාරිකාවක යෙදෙන ලදි.



(4) දින 10 ක විදේශීය හමුදාමය ආයතන වල අධ්‍යන චාරිකාවක් ඉන්දුනීසියාව, පකිස්ථානය, මැලේසියාව, ඉන්දියාව යන රටවල 2012 ඔක්තෝම්බර් මස 15 දින සිට 25 දින දක්වා යෙදුනි.










ඇ. **<u>3 වන වාරය</u>**

(1) 2012 අගෝස්තු 16 වන දින බටහිර නාවික විධානය, වරාය අධිකාරිය සහ කොළඹ ඩොක්යාර්ඩ් ආයතනය ශිෂ්‍ය නිලධාරින් විසින් චාරිකාවක යෙදෙන ලදි.



(2) නාවික ශිෂ්‍ය නිලධාරින් විසින් කොළඹ මහ බැංකුව 2012 අගෝස්තු 21 වන දින චාරිකාවක යෙදෙන ලදි.



(3) 2012 සැප්තැම්බර් 27 දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව නරඹන ලදි.



## 30. විශේෂ අවස්ථා

අ. **විදේශ දූත කණ්ඩායම් වල චාරිකා**. පහත සඳහන් විදේශ දූත කණ්ඩායම් ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ චාරිකාවන්හි යෙදෙන ලදි.

(1) බංගලාදේශ සන්නද්ධ හමුදාවේ යුධ පුහුණු පාඨමාලා දූත පිරිස 2012 ජූලි මස 4 දින ආසේඅමාවි සංචාරය.

(2) බෘනායි රාජකිය හමුදාධිපති බ්‍රිගේඩියර් ජෙනරල් ඩාටෝ සෙරි පල්වන් හජි යුසුප් බින් හජි අබ් රහමන් 2012 අගෝස්තු මස 7 දින ආසේඅමාවි සංචාරය.



(3) චින සමුහ ආණ්ඩුවේ ජාතික ආරක්ෂක අමාත්‍ය ලියන් ග්වන්ග්ලි මහතා 2012 අගෝස්තු මස 30 දින ආසේඅමාවි සංචාරය.



(4) ශ්‍රී ලංකාවේ ඉන්දියානු මහකොමසාරිස් ගරු අශෝක් කේ කන්තා මහතා 2012 නොවැම්බර් මස 22 දින ආසේඅමාවි සංචාරය.



(5) එංගලන්ත ස්කොට්ලන්ත පොලිස් විද්‍යාලයේ සමාජිකයින් පිරිසක් 2012 නොවැම්බර් මස 23 දින ආසේඅමාචි සංචාරය.



ආ. <u>**ජ්‍යෙෂ්ඨ හමුදා ප්‍රධානීන්ගේ චාරිකා**</u>. පහත සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරින් ආරක්‍ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයෙහි 2012 වර්ෂයේ චාරිකාවන්හි යෙදෙන ලදි.

(1) ගුවන් හමුදාධිපති තුමා 2012 නොවැම්බර් 28 දින විද්‍යාලයේ චාරිකාවක යෙදෙන ලදි.



(2) නාවික හමුදාධිපති තුමා 2012 නොවැම්බර් 30 දින විද්‍යාලයේ චාරිකාවක යෙදෙන ලදි.



(3) යුධ හමුදාධිපති තුමා 2012 දෙසැම්බර් 3 දින විද්‍යාලයේ චාරිකාවක යෙදෙන ලදි.



(4) ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි තුමා 2012 දෙසැම්බර් 6 දින විද්‍යාලයේ නිරීක්ෂණ චාරිකාවක යෙදෙන ලදී.



ඇ. **අධ්‍යාපනික වැඩසටහන්**. පහත සඳහන් අධ්‍යාපනික වැඩ සටහන් 2012 වර්ෂයේ තුළදී ආරක්ෂක විද්‍යාලයේදී පවත්වන ලදී.

(1) ජාත්‍යන්තර මානව නීති පිළිබඳ වැඩ මුළුව ජාත්‍යන්තර රතු කුරුස සංගමයේ නිලධාරින් විසින් 2012 ජුලි 18 දින සිට 20 දින දක්වා පවත්වන ලදී.




(2) ඒකාබද්ධ යුධ අභ්‍යාසය පිළිබඳ වැඩමුළුව 2012 අගෝස්තු 27 දින සිට 30 දින දක්වා බංගලාදේශ මිරිපූර් හි හමුදා නිලධාරින් විසින් සිදු කරන ලදී.



ඉ. **උපාධි ප්‍රධානෝත්සවය**. ආසේඅමාවි පාඨමාලා අංක 6 උපාධි ප්‍රධානෝත්සවය 2012 දෙසැම්බර් 20 දින අරලියගහ මන්දිරයේ ප්‍රධාන ශාලාවේදී පැවැත්විණි. විදේශ කටයුතු අමාත්‍ය ආචාර්ය ජී එල් පීරිස් මහතා ප්‍රධාන ආරාධිත අමුත්තා වූ අතර, ආරක්ෂක ලේකම් ගරු ගෝඨාභය රාජපක්ෂ මහතා, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි, ත්‍රිවිධ හමුදාධිපතිවරු සහ තවත් විශේෂිත ආරාධිත අමුත්තන් මේ සඳහා සහභාගී විය. ආසේඅමාවි පාඨමාලා අංක 6 ත්‍යාග හිමිකරගත් ජයග්‍රාහීන් පහත පරිදි වේ.



(1) ලබාගත් ලකුණු අනුව පළමු ස්ථානය (යුධ හමුදා අංශය)
මේජර් පි ජී ටි යු බි ජයරත්න ශ්‍රීලකාහ

(2) ලබාගත් ලකුණු අනුව පළමු ස්ථානය (නාවික හමුදා අංශය)
ලුතිනන් කොමාණ්ඩර් වයි ආර් එදිරිසිංහ

(3) ලබාගත් ලකුණු අනුව පළමු ස්ථානය (ගුවන් අංශය)
වින්ග් කොමාණ්ඩර් දේවජිශ් කුට්රිට් - ඉන්දියාව

(4) ස්වර්ණමය පන්හිඳ ත්‍යාගය
හොඳම සේනාවිධායක නිබන්ධනය ඉදිරිපත් කිරීම වෙනුවෙන් ත්‍යාගය මේජර් එම් ඒ කේ ආර් කේ අබේවික්‍රමසිංහ ශ්‍රීලංඉ විසින් ජයග්‍රහනය කරන ලදි

ඊ. **උපාධි ප්‍රධානෝත්සවයේ රාත්‍රී සාදය**. 2012 දෙසැම්බර් 21 වන දින උපාධි ප්‍රධානෝත්සවය වෙනුවෙන් පැවැත්වෙන රාත්‍රී භෝජන සංග්‍රහය විද්‍යාලීය නිලධාරි නිවස්නයේදී පවත්වන ලදි.



**31. විදුහලේ වෙනත් සමාජීය ක්‍රියාකාරකම්**. පහත සඳහන් ක්‍රියාකාරකම් විදුහල තුළ 2012 වර්ෂයේදී පැවැත්විනි.

අ. අන්තර් කණ්ඩායම් ක්‍රිකට් තරගාවලිය 2012 ජනවාරි 21 දින විදුහල් භූමියේදී පැවැත්විනි.



ආ. සිංහල හින්දු අලුත් අවුරුද්ද 2012 අප්‍රේල් 7 වන දින විදුහල් භූමියේදී සියලු නිලධාරීන් සහ සෙසු නිලයින්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදි.



ආ. විද්‍යාලීය "හැප්රන්" ක්‍රියාකාරකම 2012 සැප්තැම්බර් 8 දින නිලධාරීන් සහ ඔවුන්ගේ පවුල්වල අයගේ සහභාගීත්වයෙන් පවත්වන ලදි.



ඇ. විද්‍යාලීය "පැන්ටොමයිම්" ක්‍රියාකාරකම නිලධාරීන්ගේ රංගන කුසලතා එලි දැක්වීම සඳහා 2012 දෙසැම්බර් මස 6 වන දින විදුහල් භූමියේදී පවත්වන ලදි.



ඇ. වාර්ෂික සුහද චාරිකාව 2012 දෙසැම්බර් මස 8 දින කුකුලේගඟ යුධ හමුදා නිවාඩු නිකේතනයේදී පවත්වන ලදි.



32. <u>කාන්තා සමාජය</u>. විද්‍යාලීය කාන්තා සමාජයේ සමාරම්භක උත්සවය 2012 පෙබරවාරි 10 දින සියලුම නිලධාරීන්ගේ භාර්යාවන්ගේ සහභාගීත්වයෙන් ආරම්භ විය. එකිනෙකාගේ දැනුම බෙදා ගැනීම සහ ත්‍රිවිධ හමුදා නිලධාරී භාර්යාවන් අතර සුහදත්වය වර්ධනය උදෙසා මෙම කාන්තා සමාජය පැවැත්වෙන අතර, 2012 වර්ෂය පුරා පැවති විවිධ වැඩ සටහන් පහත පරිදි වේ.

අ. රූපලාවන්‍ය පිලිබද ප්‍රදර්ශණ වැඩසටහනක් මිනෝෂිති ර්ක්‍රම් මහත්මිය විසින් 2012 මාර්තු 16 දින පවත්වන ලදි.



ආ. කේක් සැදීම පිළිබඳ ප්‍රදර්ශන වැඩමුළුවක් සුහාලති ජයරත්න මහත්මිය විසින් 2012 අප්‍රේල් මස 5 දින පවත්වන ලදි.



ඇ. වෙසක් බැති ගී වැඩසටහන 2012 මැයි 4 දින පවත්වන ලදි.



ඈ. 'කාන්තා රාත්‍රිය' විවිධ විනෝදකාමී වැඩසටහන් සමගින් 2012 ඔක්තෝබර් මස 11 වන දින විදුහල් භූමියේදී පවත්වන ලදි.



ඉ. කාන්තා උපන්දින උත්සව වරින්වර පවත්වන ලදි.



## පාලන සහ හඨ කාර්ය සම්පාදනය

**33**. පාලන හා හඨ කාර්ය සම්පාදන අංශය. විද්‍යාලයේ කාර්යක්ෂම පැවැත්ම සඳහා අවශ්‍ය සියලුම සේවා හා පහසුකම් විදුහල වෙත ඉල්ලීම සහ ලබා දීම මෙම අංශයේ ප්‍රධාන අරමුණ වේ. කාර්යක්ෂම ඵලදායි සේවාවක් ලබා දීම සඳහා පහත සඳහන් අංශ පාලන සහ හඨ කාර්ය සම්පාදන අංශය යටතේ ක්‍රියාත්මක වේ.

අ. ප්‍රසම්පාදන අංශය
ආ. ලැබීම් පොළ
ඇ. ප්‍රවාහන අංශය
ඈ. නිලධාරි නිවස්නය
ඉ. බති/සැර නිවස්නය
ඊ. කෝප්‍රල් සමාජය
උ. සෙසුනිල භෝජනාගාරය
ඌ. හඨ නිවාස අංශය
එ. ඉංජිනේරු සේවා රෙජිමේන්තුව
ඒ. වෛද්‍ය මධ්‍යස්ථානය

**34**. ඉහත අංශයන් මගින් 2012 වර්ෂය තුළදී ක්‍රියාත්මක වූ සේවාවන් පිළිබඳව විස්තර

අ. ප්‍රසම්පාදන අංශය - මෙම අංශය මගින් විදුහලට අවශ්‍ය භාණ්ඩ හා සේවාවන් නියමිත ප්‍රසම්පාදන නිතිරිති අනුව භාණ්ඩ හා සේවාවන් ලබා ගන්නා අතර, මේ සියලු කටයුතු මූල්‍ය රෙගුලාසි අනුව සිදු කෙරේ. 2012 වර්ෂයේ ප්‍රසම්පාදන කටයුතු පහත පරිදි වේ.

(1) ඉංජිනේරු උපකරණ මිලදී ගැනීම
(2) බැරුක්ක උපකරණ මිලදී ගැනීම
(3) ජායාස්ථ පිටපත් යන්ත්‍ර/ පරිගණක ශීතකරණ අමතර කොටස් මිලදී ගැනීම
(4) ප්‍රවාහන අංශය සඳහා අමතර කොටස් මිලදී ගැනීම
(5) ප්‍රවාහන සේවා සහ අලුත්වැඩියාව
(6) දේශණ ගාස්තු සම්භාෂණ හා සැරසිලි වියදම්
(7) ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම්
(8) ක්‍රීඩා භාණ්ඩ මිලදී ගැනීම
(9) අලුතින් පවරා ගන්නා ලද ඉඩම් සඳහා මිනින්දෝරු සැලැස්ම පිළියෙල කිරීම
(10) මුද්‍රණ කටයුතු

ආ. **ලැබීම් පොළ** ටෙන්ඩර් මණ්ඩලය විසින් අනුමත කර ගන්නා ලද සියලු භාණ්ඩ නිසි පරිදි ලියාපදිංචි කර ලේඛණ ගත කර ඒ සියලු භාණ්ඩ සේනාවිධායකගේ අනුමැතියකින් පසු හඨනිවාස ගබඩාව වෙත නිකුත් කරයි.

ඇ. **ප්‍රවාහන අංශය**

| යුධ (a) | නාවික (b) | ගුවන් (c) | ආරක්ෂක අමාත්‍යාංශයේ (d) | කුලී පදනම මත (e) |
|---|---|---|---|---|
| 17 | 02 | 02 | 17 | 04 |

වගුව - **3**

(1) විදුහලේ ප්‍රවාහන අංශය සතුව වාහන රුසක් ඇති අතර, පහත සඳහන් වාහන ආරක්ෂක අමාත්‍යාංශය මගින් 2012 වර්ෂයේදී විදුහල වෙත ලබා දී ඇත.

KR 8591 (සුසුකි මරුටි කාර් රථය)
KR 8614 (සුසුකි මරුටි කාර් රථය)

(2) ආසේඅමාවි සතුව ඇති වාහන විස්තර:

යුධ හමුදාව සතුව ඇති වාහන

| අංකය | වාහන අංකය | වාහන වර්ගය |
|---|---|---|
| 1. | යුහ 26138 | ටොයොටා කෝස්ටර් බස් රථය |
| 2. | යුහ 26141 | ටොයොටා කෝස්ටර් බස් රථය |
| 3. | යුහ 7436 | ටාටා 16 x 12 ට්‍රක් රථය (ධා/ඉ කර ඇත) |
| 4. | යුහ 23080 | ටාටා එස්ඩී 13 x 13 ට්‍රක් රථය |
| 5. | යුහ 4138 | ඔැපේ ටැක්ටර් රථය |
| 6. | යුහ 4841 | ටෝයොටා ලැන්ඩ් කෘසර් 3 ජිප් රථය |
| 7. | යුහ 18048 | ලැන්ඩ් රෝවර් මාක් 3 ජිප් රථය |
| 8. | යුහ 21504 | මිත්සුබිසි එල් 300 වෑන් රථය |
| 9. | යුහ 19072 | ඉසුසු ඩබල් කැබ් රථය |
| 10. | යුහ 2181 | ටොයෝටා ඩබල් කැබ් රථය (ධා/ඉ කර ඇත) |
| 11. | යුහ 19039 | මිත්සුබිසි එල් 300 ඩබල් කැබ් රථය |
| 12. | යුහ 10410 | යමහ මෝටර් බයික් |
| 13. | යුහ 10621 | හිරෝ ස්ට්‍රීම් මෝටර් බයික් |
| 14. | යුහ 4424 | ට්‍රැක්ටර් ටේලරය |
| 15. | යුහ 9022 | වතුර බවුසරය |
| 16. | යුහ 26416 | ටොයොටා ස්ටාර් බස් රථය(A/C) |
| 17. | යුහ 3393 | ට්‍රැක්ටර් ටේලරය (ධා/ඉ කර ඇත) |

වගුව -4

නාවික හමුදාව සතුව ඇති වාහන

| අංකය | වාහන අංකය | වාහන වර්ගය |
|---|---|---|
| 1. | නාහ 5597 | නිසාන් සිවිලියන් බස් රථය |
| 2. | නාහ 6024 | ටොයොටා වෑන් රථය |

වගුව -5

ගුවන් හමුදාව සතුව ඇති වාහන

| අංකය | වාහන අංකය | වාහන වර්ගය |
|---|---|---|
| 1. | ජී 3627 | රෝසා බස් රථය |
| 2. | ජී 3703 | ලංකා අශෝක් ලේලන්ඩ් |
| 3. | ජී 3822 | ලංකා අශෝක් ලේලන්ඩ් |

වගුව -6

ආරක්ෂක අමාත්‍යාංශය විසින් සපයා ඇති වාහන

| අංකය | වාහන අංකය | වාහන වර්ගය |
|---|---|---|
| 1. | කේඑෆ් 3471 | නිසාන් සනි කාර් රථය |
| 2. | කේඑෆ් 3697 | නිසාන් සනි කාර් රථය |
| 3. | එල්ඊ 8419 | මිත්සුබිසි සින්ගල් කැබ් රථය |
| 4. | එල්ඊ 8420 | මිත්සුබිසි සින්ගල් කැබ් රථය |
| 5. | එන්ජී 5801 | මිත්සුබිසි එල් 300 වෑන් රථය |
| 6. | එන්ජී 7343 | ෆූසො බස් රථය |
| 7. | ආර්ජී 8869 | ට්‍රැක්ටර් රථය |
| 8. | ටීඑස් 1409 | යමහ 106 මෝටර් බයික් |
| 9. | ටීඑස් 1404 | යමහ 106 මෝටර් බයික් |

| | | |
|---|---|---|
| 10. | ටිඑස් 1414 | යමහ 106 මෝටර් බයික් |
| 11. | ටිඑස් 1419 | යමහ 106 මෝටර් බයික් |
| 12. | බියුඑම් 5327 | බජාජ් ත්‍රී විලර් |
| 13. | එල්එෆ් 3072 | ටාටා ඩබල් බවුසර් |
| 14. | පිසි 5484 | ටාටා ඩබල් කැබ් |
| 15. | එන්බි 1012 | අශෝක් ලේලන්ඩ් බස් රථය |
| 16. | ඩබ්පිකේආර් 8591 | සුසුකි මරුටි කාර් රථය |
| 17. | ඩබ්පිකේආර් 8614 | සුසුකි මරුටි කාර් රථය |

වගුව - 7

**කුලී ගෙවීමේ පදනම මත ලබාගත් වාහන**

| අංකය | වාහන අංකය | වාහන වර්ගය |
|---|---|---|
| 1. | ජිඑෆ් 1171 | ටොයොටා කාර් රථය |
| 2. | ජිජ් 7098 | ටොයොටා කාර් රථය |
| 3. | එච්ජේ 9664 | ටොයොටා කාර් රථය |
| 4. | කේඩි 7099 | ටොයොටා කාර් රථය |

වගුව - 8

ඇ. **නිලධාරි නිවස්නය** අදාල වශයෙන් නිලධාරීන් 166 දෙනෙකු (ශිෂ්‍ය නිලධාරීන් 92 උපදේශක හා නිත්‍ය කාර්ය නිලධාරීන් 63 දෙනෙකු සහ විදේශිය ශිෂ්‍ය නිලධාරීන් 11 දෙනෙකු සඳහා අවශ්‍ය භෝජනාගාර පහසුකම් 2012 වර්ෂයේදී උසස් අන්දමින් සපයා ඇත. උපාධි ප්‍රධානෝත්සවයට පෙර නිලධාරි නිවස්නයේ විවේකාගාර ගොඩනැගිල්ල පිළිසකර කිරීම සහ තිර රෙදි දැමීම සිදු කරන ලදී.

ඉ. **බති සැරයන් භෝජනාගාරය** බලලත් නිලධාරීන් සහ සැරයන්වරුන් 64 දෙනෙකුගෙන් සමන්විත පිරිසක් මෙහි ප්‍රයෝජන ගන්නා අතර ආහාර සහ නවාතැන් පහසුකම් නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ ඔවුන් හට සැපයේ.

ඊ. **කෝප්‍රල් සමාජ ශාලාව** කෝප්‍රල් සමාජ ශාලාවේ පහසුකම් හා සෙසු කටයුතු අධීක්ෂණය නිලධාරියෙකුගේ යටතේ සිදු කෙරේ

උ. **සෙසුනිල භෝජනාගාරය** ආයතනය විසින් සෙසුනිල සමාජයේ කටයුතු ඉහළ දැමීම සහ පහසුකම් සැපයීමේ අරමුණින් පහත සඳහන් කාර්ය සිදු කර ඇත

(1) පුටු මේස අලුත්වැඩියාව
(2) ගොඩනැගිලි පින්තාරු කිරීම
(3) දොර ජනේල් අලුත්වැඩියාව
(4) විදුලි පංකා අලුත්වැඩියාව
(5) මේස රෙදි හා තිරරෙදි අලුත්වැඩියාව

ඌ. **හඨ නිවාස අංශය** මෙම අංශය මගින් විදුහලේ සියලු අලුත්වැඩියා කටයුතු හා නඩත්තු කටයුතු සිදු කිරීම වගකීම වන අතර, පුහුණු ආධාරක අංශයට උපකාර කිරීමද සිදු වේ.

එ. **ඉංජිනේරු සේවා රෙජිමේන්තු අංශය** විදුහලේ ඉංජිනේරු සේවා අංශයට පහත සඳහන් වගකීම් පැවරේ.

(1) ගොඩනැගිලි වෙනත් පහසුකම් හා පුහුණු උපකරණ නිර්මාණය කිරීම නඩත්තුව සහ අලුත්වැඩියා කිරීම.
(2) ජලය සහ විදුලිය සැපයුම.
(3). පහත සඳහන් ඉදිකිරීම ඉසේරෙ මගින් 2012 දී සිදු කර ඇත.

| අ.අ | විස්තරය | වැය වූ මුදල රු: |
|---|---|---|
| 1. | ශිෂ්‍ය නිලධාරි සහායක සෙනින් සඳහා හය නිවාසයක් ඉදිකිරීම | 600,000.00 |
| 2. | සිවිල් සේවක මහතුන් සඳහා නේවාසිකාගාරයක් ඉදිකිරීම | 600,000.00 |
| 3. | තරුණ සේවා ප්‍රදේශයේ නව මුරහලක් ඉදිකිරීම | 350,000.00 |
| 4. | ගෘහස්ථ ක්‍රීඩාගාරයක් ඉදිකිරීම | 896,000.00 |
| 5. | තරුණසේවා භූමියේ අඩි 200 තාප්පයක් ඉදිකිරීම | 328,000.00 |

වගුව - 9

ඒ. <u>වෛද්‍ය මධ්‍යස්ථානය</u> ආසේඅමාවි වෛද්‍ය මධ්‍යස්ථානය දෛනික බාහිර රෝගී ප්‍රතිකාර සේවාවක් සිදු කරන අතර, රෝගීන් සඳහා සුළු ප්‍රතිකාර කරනු ලැබේ. වැඩිදුර ප්‍රතිකාර අවශ්‍ය රෝගීන් හමුදා රෝහල් වෙත යොමු කරනු ලැබේ. ත්‍රිවිධ හමුදාව මගින් වෛද්‍ය නිලධාරීන් මාසිකව සේවාවේ යොදවයි. 2012 වර්ෂය තුළදී ප්‍රතිකාර ලබා ගත් සංඛ්‍යාව පහත පරිදි වේ.

| | | | |
|---|---|---|---|
| (1) | නිලධාරි | - | **553** |
| (2) | ත්‍රිවිධ හමුදා සාමාජිකයින් (සෙසුනිල) | - | **2663** |
| (3) | සිවිල් සේවකයින් | - | **579** |
| (4) | විදේශීය ශිෂ්‍ය නිලධාරීන් | - | **42** |

<u>දන්ත වෛද්‍ය සඳහා</u>

| | | | |
|---|---|---|---|
| (1) | නිලධාරි | - | **54** |
| (2) | සෙසුනිල | - | **212** |
| (3) | සිවිල් සේවකයින් | - | **38** |
| (4) | විදේශීය ශිෂ්‍ය නිලධාරීන් | - | **21** |

ඔ. මීට අමතරව විද්‍යාලීය වෛද්‍ය අංශය මගින් පහත සඳහන් සේවාවන්ද ඉටුකර ඇත.

(1) වාර්ෂික සහ වාර අවසාන ශාරීරික යෝග්‍යතා පරීක්ෂණ සිදු කිරීම.
(2) වෛද්‍ය සහ සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන්.
(3) බෝවන රෝග සහ වසංගත රෝග නිවාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- (අ) ඩෙංගු.
- (ආ) අරක්කැමින් හා භෝජනාගාර සේවකයින් පරීක්ෂාව.
- (ඇ) ආසේඅමාවි මාසික වෛද්‍ය පරීක්ෂණ.

**35.** <u>සුභ සාධන පහසුකම්</u> පහත සඳහන් සුභ සාධන පහසුකම් ආසේඅමාවි රාජකාරි කරන නිලධාරීන් සහ සෙසුනිලයන් සඳහා සපයා ඇත.

අ. විද්‍යාලයේ දැනට ඇති ක්‍රීඩාගාරය සහ එහි පහසුකම් භාවිතා කරන අතර, නව ක්‍රීඩාගාරයක් සහ ක්‍රීඩාපිටියක් ඉදිකිරීම සඳහා සැලසුම් සකස් කරමින් තිබේ.

ආ. පහත සඳහන් පහසුකම්ද විද්‍යාලයේ සේවය කරන නිලධාරි සෙසුනිලයින් සහ සිවිල් සේවකයන් සඳහා සපයා ඇත.

(1) ආපන ශාලාව.
(2) ජන අවන්හල සහ සුභසාධක වෙළෙඳසැල.
(3) නොම්ලේ විදුහලේ සිට කිරිබත්ගොඩ දක්වා යාමට හා ඒමට ප්‍රවාහන පහසුකම්.

36. <u>ගණකාධිකාරි කාර්යාලය</u>. රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යංශය විසින් පත් කරන ලද ගණකාධිකාරවරයෙකු විද්‍යාලය වෙත ලබා දී ඇත.

අ. ගණකාධිකාරි කාර්යාලය වෙතින් ඉටුකරනු ලබන සේවාවන්.

(1) කලට වෙලාවට මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම.

(2) අයවැය වාර්ථා (වාර්ෂික) පිළියෙල කිරීම.

(3) සියළුම අදායම් සහ වියදම් නිවැරදිව වර්ගීකරණය කිරීම හා වාර්ථා කිරීම.

(4) මාසික බැංකු සැසඳුම් ප්‍රකාශණ පිළියෙල කිරීම.

(5) ගිණුම් පාලන ක්‍රම ස්ථාපනය කර නඩත්තු කිරීම.

(6) රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යංශය, මුදල් අමාත්‍යංශය, දේශීය අදායම් දෙපාර්තුමේන්තුව වැනි රාජ්‍ය ආයතන සමග සහසම්බන්ධතාවයෙන් කටයුතු කිරීම.

(7) නියමිත කාලයට අදාලව මූල්‍ය ප්‍රතිපාධන ඉල්ලුම් කිරීම සහ ගෙවීම් කටයුතු සිදු කිරීම.

(8) විද්‍යාලයේ සේවය කරන සිවිල් සේවකයින්ගේ මාසික වේතන සකස් කිරීම හා ගෙවීම් කටයුතු සිදු කිරීම.

(9) විද්‍යාලයේ ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීනව පවත්වාගෙන යාම.

(10) විද්‍යාලයේ අවශ්‍යතාවය පරිදි වෙනත් රාජකාරි ඉටු කිරීම.

ආ. ගණකාධිකාරි කාර්‍යාලය ගණාකාධිකාරිවරයෙකු සහ කළමණාකාර සහයකයින් තිදෙනෙකුගෙන් සමන්විත වේ.

ඇ. ආසේඅමාවි හි 2012 මූල්‍යමය ප්‍රකාශණය කළමණාකරණ මණ්ඩලයේ අනුමැතියෙන් පසු ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යංශය වෙත ඉදිරිපත් කර ඇති අතර, මෙයට ඇමුණුම 'අ' වශයෙන් ඇත.

ඈ. රුපියල් මිලියන 103 ක් පුනරාවර්ථන වියදම් සහ මිලියන 140ක් ප්‍රාග්ධන වශයෙන් 2012 වසරේ වියදම් කර ඇති අතර, සියළු වියදම් මුදල් පොත්, නියමිත වැය ශීර්ෂ යටතේ සඳහන් කර ඇත.

37. <u>සිවිල් පරිපාලන කාර්යාලය</u>. 2012 වර්ෂය ආරම්භයේදි ඉදුරාම ආසේඅමාවි වෙත බඳවා ගන්නා ලද සිවිල් කාර්‍ය මණ්ඩලය 89 දෙනෙකුගෙන් සමන්විත වූ අතර, පුරප්පාඩු පවතින තනතුරු 9 වෙනුවෙන් බඳවා ගැනීම් සිදු කිරීමට 2012 වර්ෂය තුල කටයුතු කරන ලදි.

අ. සිවිල් පරිපාලන කාර්යාලය මගින් පහත සඳහන් රාජකාරි කරනු ලබයි.

(1) සිවිල් කාර්‍ය මණ්ඩලයේ දෛනික පාලන හා පරිපාලන කටයුතු සිදු කිරීම.

(අ) පැමිණීමේ හා පිටවීමේ ලේඛණය නඩත්තු කිරීම.
(ආ) නිවාඩු/කෙටි නිවාඩු ලේඛණය පවත්වාගෙන යාම.
(ඇ) රාජකාරි අවශ්‍යතාවය අනුව සිවිල් සේවක මහතුන් රාජකාරි සඳහා අනුයුක්ත කිරීම.

(2) සිවිල් කාර්‍ය මණ්ඩලය බඳවා ගැනීමට අනුමැතිය ලබා ගැනීම, බඳවා ගැනීම සහ බඳවා ගැනීමෙන් අනතුරුව අභ්‍යන්තර අනුයුක්ත කිරීම සිදු කිරීම.

(3) සිවිල් කාර්ය මණ්ඩලය බඳවා ගැනීමෙන් අනතුරුව රාජ්‍ය බුද්ධි සේවය වෙතින් ආරක්ෂණ නිෂ්කාශණ වාර්ථා ලබා ගැනීම.

(4) සිවිල් කාර්ය මණ්ඩලය විශ්‍රාම ගැන්වීම.

(5) සිවිල් කාර්ය මණ්ඩලයේ විනය පවත්වාගෙන යාම සහ අවශ්‍ය අවස්ථාවන්හිදි උපදෙස් ලබාදීම.

(6) විද්‍යාලයීය රාජකාරි අවශ්‍යතාවය අනුව සිවිල් කාර්ය මණ්ඩලය රාජකාරියෙහි යෙදවීමට පියවර ගැනීම.

(7) සිවිල් කාර්ය මණ්ඩලයට වැටුප් හා දීමනා ලබාදීම.

(8) කඳවුරෙන් පිටත අභ්‍යාසයන් පවත්වන අවස්ථාවලදි ඒ සඳහා රාජකාරියෙහි යෙදවූ සිවිල් සේවක මහතුන් හට ගමන් වියදම් දීමනා හා අතිකාල දීමනා ගෙවීම.

ආ. මෙම කාර්යාලය සිවිල් පරිපාලන නිලධාරියෙකු හා කළමනාකරණ සහකාරවරුන් දෙදෙනෙකුගෙන් සමන්විත වේ.

38. <u>අභ්‍යන්තර විගණන කාර්යාලය</u>

අ. ආසේඅමාවි විද්‍යාලය ස්වාධීන ආයතනයක් බවට පත් වූවාට පසු අභ්‍යන්තර විගණන කාර්යාලයක් මුදල් අංශයට පරිබාහිරව පිහිටුවන ලදි. එසේ වූවද මෙම කාර්යාලය සේනාවිධායක තුමාට හා කළමනාකරණ මණ්ඩලයට වගකීව යුතුවේ.

ආ. අභ්‍යන්තර විගණන කාර්යාලය ගණකාධිවරයකු සහ ගිණුම් ලිපිකරුවන් දෙදෙනෙකුගෙන් සමන්විත වේ.

ඇ. අභ්‍යන්තර විගණන කාර්යාලයේ කාර්යභාරය පහත පරිදිය.

(1) වාර්ෂික විගණන වාර්ථා පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම.

(2) පවතින විගණන ක්‍රියාදාමය කාලීනව ඇගයීම සහ එහි ඇති දුර්වලතා හා ප්‍රතිපලදායි ක්‍රියාවන් හඳුනා ගැනීම සහ ඒවාට පිළියම් යෝජනා කිරීම.

(3) විගණන කළමනාකාර කමිටුව කැඳවා, මූල්‍යමය වාර්ථා, තොග වාර්ථා, සහ අවශ්‍ය ලිපි ලේඛණ පරීක්ෂා කර බලා එහි කරුණු අභ්‍යන්තර විගණන වාර්ථාවට ඇතුල් කිරීම.

(4) ව්‍යවස්ථානුකූල නීති රීති චක්‍රලේඛණ හා උපදෙස් මාලා නිසි පරිදි ක්‍රියාත්මක කරනවාදැයි පරීක්ෂාකාරීව සිටීම.

(5) මහා භාණ්ඩාගාරය පොදු ව්‍යාපාර පිළබඳ කාරක සභාව සඳහා අවශ්‍ය නිර්දේශ හා නිගමන පිළියෙල කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය දත්ත තොරතුරු පිළියෙල කිරීම.

ඇ. **2011** වර්ෂයේදි විගණන හා කළමනාකරණ කමිටු රුස්වීම් **3** ක් පවත්වා ඇති අතර, පැන නැගී තිබූ ගැටලු හඳුනාගෙන එමගින් විදුහලේ අභ්‍යන්තර විගණන පාලන ක්‍රමය ශක්තිමත් කිරීමට පියවර ගැනීම.

**39.** **<u>වර්ෂය තුළ සිදු කරනු ලැබූ යටිතල පහසුකම් සංවර්ධණය</u>** ඉහත **"33"** ඡේදයේ උප ඡේද " ඒ" හි සඳහන් කරන ලද සංවර්ධන කටයුතු කරනු විට පහත සඳහන් ඉදිකිරීම් ද සිදුකර ඇත.

| අංකය | විස්තරය | කොන්ත්‍රාත්කරු | වෙනත් |
|---|---|---|---|
| 1. | ඇලුමිණියම් ෆැබ්රිකේෂන් නිම කිරීම - අවන්හල | ඇලුකෙයා (පුද්ගලික සමාගම) රු. 809,838.40 | සම්පූර්ණයි |
| 2. | ටෙනිස් පිටිය නවීකරණය | බිස්ටෙක් (පුද්ගලික සමාගම) රු. 947,500.00 | |
| 3. | අභ්‍යන්තර මාර්ග කාපට් කිරීම | කැන්ඩි කන්ස්ට්‍රක්ෂන් රු. 15,234,527.62 | |
| 4. | ක්ෂේත්‍ර වැසිකිළි 02 ක් හා වැසිකිළි 02 ඉදිකිරීම | AIM ඉන්ජිනියරින් රු. 607,000.00 | |
| 5. | ලිපිද්‍රව්‍ය වෙළඳ සැල නවීකරණය | AIM ඉන්ජිනියරින් රු. 379,453.00 | |
| 6. | අවන් හල ඉදිරිපස සිමින්ති ගල් ඇතිරීම | නිශාන්එන්ටර් ප්‍රයිසස් රු. 28,399.65 | |
| 7. | ආපන ශාලාව ඉදිරිපස සිමින්ති ගල් ඇතිරීම | නිශාන් එන්ටර් ප්‍රයිසස් රු. 67,999.95 | |

**වගුව -10**

**40.** 2011 වර්ෂයේ වෙන් කරන ලද මුදල් ප්‍රතිපාධන මගින් පහත සඳහන් ඉදිකිරීම් ආරම්භ කරන ලද අතර, ඉතිරි වැඩ කටයුතු නිම කල යුතුය.

| අ.අ | විස්තරය | වගකීම | විශේෂ |
|---|---|---|---|
| 1. | මහල් හතරකින් යුත් සින්ඩිකේට් ගොඩනැගිල්ල | ශ්‍රී ලංකා නාවික හමුදාව රු:මි: 46.20 | 2011 වර්ෂයේ හි 20% සම්පූර්නය |
| 2. | ශිෂ්‍ය නිලධාරි විවාහක නිවාස (බ්ලොක් 03) ඉදිකිරීම | ශ්‍රී ලංකා ගුවන් යමුදාව රු:මි: 96.00 | 2011 55%ක් නිමයි ඉතිරිය 2012 දි නිම කල යුතුවේ |
| 3. | ද්විත්ව මාර්ග ඉදිකිරීම් | ශ්‍රී ලංකා ගුවන් යමුදාව රු:මි: 12.3 | 2011 දි 30%ක් නිම වී ඇත |

**වගුව -11**

**41.** <u>විශේෂ ව්‍යාපෘති</u> රජයේ "අපි වෙනුවෙන් රට නගමු" ව්‍යාපෘතිය යටතේ විද්‍යාලයට අයත් කුඹුරු අක්කර 4ක් වගා කල අතර, ඒ වෙනුවෙන් රු:146,000.00 මුදලක් ආයෝජනය කල අතර අපේක්ෂිත ආදායම දළ වශයෙන් රු: 250,000:00 කි.

## <u>නිර්දේශ</u>

**42.** වර්ධනය වන ශිෂ්‍ය නිලධාරි සංඛ්‍යාව සහ කාර්ය මණ්ඩලය සඳහා නැවතිමේ පහසුකම් සැපයීමට දැනට විද්‍යාලයේ තිබෙන නවාතැන් පහසුකම් වැඩි දියුණු කල යුතු වේ.

**43.** පරිගණක විද්‍යාගාරය, පුස්තකාලය, ආදර්ශ පංති කාමර වැනි පුහුණු පහසුකම් වර්ධනය කල යුතු වේ.

**44.** මුද්‍රිත ලිපි මගින් කෙරෙන ලිපි ගනුදෙණු අවම කර අන්තර් ජාල සම්බන්ධතා මගින් රාජකාරි ඉක්මනින් සහ අඩු වියදමකින් සිදු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් ලබා ගැනීම.

**<u>සමාලෝචනය</u>**

45. ආසේඅමාවි කැපි පෙනෙන වර්ධනයක් සහ ප්‍රගතියක් ලබා ගනිමින් විද්‍යාලයේ අරමුණු හා ඉලක්ක කරා ළගා විමට හැකියාව ලැබි ඇත. පාඨමාලා විෂය නිර්දේශය නැවත සමාලෝචනයට ලක්කිරිමෙන් අනතුරුව වර්තමාන යුධ හමුදා ඉලක්කයන් කරා පිය නැගිමට අවශ්‍ය වෙනස්කම් බොහොමයක් විද්‍යාලිය කළමනාකරණ මණ්ඩලය තුලින් අනුමැතිය ඇතුව සිදුකර ඇත.

46. විද්‍යාලය විසින් 2012 වර්ෂයේ පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම් නිසි කළමනාකරණයකින් සිදුකර ඇති අතර, 2012 සංයුක්ත සැළැස්ම ප්‍රකාර ගොඩනැගිල්ල ඉදිකිරිම් ආරම්භ වි ඇත. 2015 වර්ෂයේ දි විද්‍යාලයේ නිමකිරිමට නියමිත ඉදිකිරිම් හා යටිතල පහසුකම් බොහෝමයක් ආරම්භ කර ඇත.

47. මුදල් ප්‍රතිපාධන වියදම් කිරිම හා මුල්‍යමය ප්‍රකාශණය රාආඅ විසින් අනුමත කර ඇති අතර, කළමනාකරණ මණ්ඩලය විසින් ක්‍රියාවට නංවා ඇත.

48. ආසේඅමාවි කැපි පෙනෙන යටිතල පහසුකම් සංවර්ධනය වි ඇති අතර, පාඨමාලා හි ත්‍රිවිධ හමුදා නිලධාරින්ගේ අවශ්‍යතාවයන් අනුව දැනට පවතින ආසේඅමාවි සැළැස්ම නැවත සමාලෝචනය කිරිමට කළමනාකරණ මණ්ඩලය විසින් 2012 වර්ෂයේදි පියවර ගැනිම කාලෝචිතය.

ඇමුණුම අ
වාර්ෂික වාර්තාව - 2012

## ගණකාධිකාරගේ ප්‍රකාශය

1. 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වාර්ෂය සඳහා වූ විද්‍යාලයේ කෙටුම්පත් මූල්‍ය ආයතන, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම් කරන ප්‍රමිතීන් (LKAS සහ SLFRS) සහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත (SLPSAS) අනුකූලව පිළියෙළ කර ඉදිරිපත් කර ඇත. මෙම මූලය ප්‍රකාශනයන් මගින් ප්‍රථම වරට SLFRS – 01 ට අනුව පිළියෙළ කරන ලද මූල්‍ය ප්‍රකාශයන් ඉදිරිපත් කරයි.

2. විද්‍යාලයේ මූල්‍ය තත්වයේ වූ වර්ධනය මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයන් නැවත වරක් පිළිඹුමු කෙරේ. සමාලෝචන වර්ෂය තුළදී රුපියල් මිලියන 6.41 ක ඌනතාවයක් පෙන්නුම් කළද, 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේදී විද්‍යාලයේ මුළු වත්කම් 4.4% ක් හෙවත් රුපියල් මිලියන 2.16 කින් වර්ධනය විය.

3. යටිතල පහසුකම් සංවර්ධනය හා ස්ථාවර වත්කම් අත්පත්කර ගැනීම වෙනුවෙන් වූ ආයෝජන මූල්‍ය තත්වයේ වර්ධනයට හේතු විය. විද්‍යාලය වෙත ලැබුණු රුපියල් මිලියන 139.80 ක මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණයෙන් රුපියල් මිලියන 113.37 ක්ම යටිතල පහසුකම් සංවර්ධනයට යෙදවිය. ඒ අතර, මහල් නිවාස 4කින් යුත් සින්ඩිකේට් ගොඩනැගිල්ල ඉදිකිරීම, ශිෂ්‍ය නිලධාරින්ගේ විවාහක නිවාස ඉදි කිරීම, ද්විත්ව මාර්ග පද්ධතිය ඉදිකිරීම, අභ්‍යන්තර මාර්ග පද්ධතිය කාපට් කිරීම, ඉන්ධන පිරවුම්හල ඉදිකිරීම හා Water Sump and Pump House (ජල ටැංකිය) ඉදිකිරීම විශේෂිත විය. තවද රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යංශයෙන් ලද වාහන දෙක සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙන් ලද බස් රථය විද්‍යාලයේ වත්කම් වර්ධනයට හේතු විය.

4. 2011 වර්ෂයේ විද්‍යාලයේ මුළු මෙහෙයුම් වියදම රුපියල් මිලියන 98.84 ක් වූ අතර, එය 2012 වර්ෂයේ රුපියල් මිලියන 109.63 දක්වා වැඩිවීමට වර්ෂය තුළදී ගිවිසුම්ගත සේවාවන් වල මිල ඉහළ යාම, පුද්ගල සංවේතන වල වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපාන ලදී.

5. 2012 වර්ෂය තුළදී ද පුනරාවර්තන හා මූලධණ ගෙවීම් සම්බන්ධව වාර්තා පවත්වා ගැනීම, කාලීන හා වර්ෂ අවසාන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම, වඩා අර්ථවත් තීරණ ගතහැකි වන පරිදි කළමණාකරණය සඳහා මූල්‍ය තොරතුරු සැපයීම, මුදල් ප්‍රවාහ කළමණාකරණය හා මුදල් කටයුතු වාර්තා පවත්වාගෙන යාම මගින් විද්‍යාලයේ මූල්‍යමය හා ගිණුම් කටයුතු සබැඳිව අපගේ වගකීම් නිසිපරිදි ඉටු කිරීමට හැකි විය. විද්‍යාලයේ මූල්‍යමය හා ගිණුම්කරණ කටයුතු වඩා විධිමත්ව හා කාලීන වෙනස්වීම් වලට අනුරූපව ඉදිරි වර්ෂ වලදීද ඉටුකිරීම සඳහා ගිණුම්කරණ අංශය වශයෙන් සූදානම් බවද සඳහන් කරමි.

**එච් එම් එන් දර්ශන**
ජ්සිජ්,ජ්සිඑම්ජ්,බිඑස්සි කළමණාකරණ (විශේෂ)
ගණකාධිකාරි

## ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ කාර්ය සාධනය

*උපාධිධාරීන්ගේ ප්‍රමාණය*

**2007ට සාපේක්ෂව 2012 වර්ෂයේ උපාධිධාරී ප්‍රමාණය 115% කින් වර්ධනය වී ඇත.**




**දේපල පිරියත සහ උපකරණ වර්ධනය**

ගොඩනැගිලි සහ පිරියත, උපකරණ සහ වාහනවල වර්ධනයක් පෙන්නුම් කරයි

රු.මිලියන




L & B - ඉඩම් සහ ගොඩනැගිලි
P & M - පිරියත, උපකරණ සහ රථ වාහන
F & E - ගෘහ භාණ්ඩ සහ උපකරණ

## වියදම් විස්තරය




PE – පුද්ගල සංවේතන

CS - ගිවිසුම්ගත සේවා

සැපයුම්කරුවන්

නඩත්තු වියදම්

*අයවැය වෙන්කිරීම් –පුනරාවර්තන වියදම්*
රු.මිලියන




*අයවැය වෙන්කිරීම් – මූලධන වියදම්*
රු.මිලියන




විදේශ ශිෂ්‍ය නිලධාරින්ගේ සහභාගීත්වය




**එච් එම් එන් දර්ශන**
ඒසීඒ,ඒසීඑම්ඒ,බීඑස්සී කළමණාකරණ (විශේෂ)
ගණකාධිකාරි

**ඇමුණුම ආ**

**වාර්ෂික වාර්ථාව - 2012**

**වාර්ෂික වාර්ථාව සඳහා අභ්‍යන්තර විගණන නිලධාරිගේ ප්‍රකාශය**

1. 2012.12.31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය තුල අභ්‍යන්තර විගණන අරමුණු ඉටු කර ගැනිම සඳහා අභ්‍යන්තර විගණන සැලැස්මක් පිළියෙල කොට ක්‍රියාවට නැංවිම මෙම අභ්‍යන්තර විගණන අංශයෙහි මූලික කාර්‍යභාරය විය. එහිදි තොග පාලනය, වැටුප්, සම්පාදන කටයුතු, ගෙවීම් අභ්‍යන්තර පාලන පද්ධතිය හා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම/ ඉදිරිපත් කිරිම යනාදි සෑම ක්ෂේත්‍රයක්ම අවරණය වන ලෙස විගණන වැඩසටහන් සකස් කර ක්‍රියාවට නංවන ලදි. එම විගණන වැඩසටහන්වල ප්‍රතිඵල ලෙස අනාවරණය වූ පහත කරුණු පිළිබඳව කළමණාකරනයේ අවධානය යොමු කරවන ලද අතර විගණන හා කළමණාකරන කමිටු රැස්වම්වලදි ද සාකච්ජාවට භාජනය කරන ලදි.

අ. 2010.12.31 න් හා 2011.12.31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂයට අදාලව පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශණ ඇතුලත් වාර්ෂික වාර්ථාවන් කඩිනමින් කැබිනට් මණ්ඩලය වෙත හා අනතුරුව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරිමේ අවශ්‍යතාවය.

ආ. රථ වාහනවල අලුත්වැඩියාවන් වලින් පසු ඉතිරිවන භාවිතයට නුසුදුසු වන යාන්ත්‍රික ප්‍රවාහන අමතර කොටස් පිළිබඳව පාලන උපක්‍රම ශක්තිමත් කිරිම හා ඒවා විධිමත් ලෙස අපහරණය කිරිමේ අවශ්‍යතාවය හා වාර්ෂික භාණ්ඩ සමීක්ෂන කටයුතු වල ප්‍රගතිය විමසා බැලිය යුතුය.

ඇ. විද්‍යාලය විසින් භාවිතා කරන රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයට, ශ්‍රී ලංකා යුධ හමුදාවට, ශ්‍රී ලංකා නාවික හමුදාවට මෙන්ම ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අයත් රථ වාහන විද්‍යාලයට පවරාගෙන එවායෙහි පාලනය විධිමත් කිරිමේ අවශ්‍යතාවය.

ඈ. ගබඩා ඉඩකඩ කළමණාකරණය කර ගැනිම සඳහාත් රජය ලැබිය හැකි අදායම් කඩිනමින් එක්රැස් කර ගැනිම සඳහාත් භාවිතයට නුසුදුසු භාණ්ඩ අයෝග්‍ය කිරිමේ මණ්ඩල නිර්දේශ පරිදි කඩිනමින් හා නිවැරදි පිළිවෙත් අනුව අපහරණය කිරිමේ අවශ්‍යතාවය.

ඉ. 2012 වර්ෂය සඳහා පිළියෙල කරන ලද අයවැය ක්‍රියාකාරි සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම හා එවා ක්‍රියාත්මක කිරිමේ ප්‍රගතිය සමාලෝචනය කිරිම හා එමගින් 2013 වර්ෂය සඳහා අවශ්‍ය ගැලපුම් ද සහිතව නව අයවැය, ක්‍රියාකාරි සැලැස්ම හා ප්‍රසම්පාදන සැලසුම් පිළියෙල කිරිමේ අවශ්‍යතාවය.

ඊ. විද්‍යාලීය ඉදිකිරිම් කටයුතු සඳහා ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබා ගැනිමෙන් පසු අදාල කොන්ත්‍රාත්කරුවන් සමග නිවැරදිව ගිවිසුම් වලට එළඹීමේ අවශ්‍යතාවය හා ගිවිසුම්වලට අසම්භාව්‍යයන් සඳහා වෙන් කරන ලද 10% ප්‍රතිපාදන ඇතුලත් නොකල යුතු බව (එවැනි අසම්භාව්‍යයන් සිදු වුවහොත් ඒවා පිළිබඳව පසුව සලකා බැලිය යුතු බව)

2. ඉහත පෙන්වා දෙන ලද කරුණු පිළිබඳව කළමණාකරණය විසින් අවධානය යොමුකර නිවැරදි කිරිම් සිදු කරන ලෙස ඉල්ලා සිටින ලදි.

3. 2012.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණන හා කළමණාකරණ කමිටු රැස්විම් වාර 4ක් පවත්වා ඇත. ඒ සඳහා නිරික්ෂකයන් ලෙස විසණකාධිපති දෙපාර්තුමේන්තුවේ නියෝජිතයන් සහ රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයිය අභ්‍යන්තර විගණන අංශයේ නියෝජිතයන්ද සහභාගි වි එම කාර්‍යයන් සාර්ථක ලෙස ඉටුකර ගැනිමට අවශ්‍ය සහයෝගය දක්වූ බවද සතුටින් සිහිපත් කරනු කැමැත්තෙමි.

**එම් එස් කලුආරච්චි**
අභ්‍යන්තර විගණන නිලධාරි

ඇමුණුම 'ඇ'
වාර්ෂික වාර්තාව 2012

## ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය - සපුගස්කන්ද
## මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

| 2012.12.31 දිනට | සටහන් | 2012 දෙසැම්බර් 31 දිනට රු | 2011 දෙසැම්බර් 31 දිනට රු | 2011 ජනවාරි 01 දිනට රු |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| දේපල පිරියත සහ උපකරණ | 02 | 660,651,140 | 634,092,346 | 480,330,931 |
| මුළු ජංගම නොවන වත්කම් | | 660,651,140 | 634,092,346 | 480,330,931 |
| **ජංගම වත්කම්** | | | | |
| තොගය | 03 | 3,807,813 | #REF! | - |
| අත්තිකාරම් සහ පෙර ගෙවීම් | 04 | 249,460 | #REF! | 14,050 |
| මුදල් හා මුදල් සමාන දෑ | 05 | 71,881 | 10,267 | 302,238 |
| මුළු ජංගම වත්කම් | | 4,129,154 | 2,511,013 | 316,288 |
| **මුළු වත්කම්** | | **664,780,294** | **636,603,359** | **480,647,219** |
| **ස්කන්ධය සහ බැරකම්** | | | | |
| සමුච්චිත අරමුදල | 06 | 589,424,584 | 594,382,950 | 451,910,711 |
| තැන්පතු ගිණුම | 07 | 2,120,955 | 1,347,246 | - |
| වෙනත් ප්‍රතිපාදන | 08 | 34,547,075 | 20,513,175 | - |
| **මුළු ස්කන්ධ හා ජංගම නොවන බැරකම්** | | **626,092,615** | **616,243,371** | **451,910,711** |
| **ජංගම වගකීම්** | | | | |
| උපචිත වියදම් | 09 | 3,569,762 | 2,737,332 | 174,261 |
| ණය හිමියන් | 10 | 35,117,917 | 17,622,656 | 28,562,247 |
| මුළු වගකීම් | | 38,687,680 | 20,359,988 | 28,736,508 |
| මුළු සමුච්චිත අරමුදල සහ වගකීම් | | **664,78,294** | **636,603,359** | **480,647,219** |

ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ ඉහතින් දක්වා ඇති මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය සහ ඉදිරිපත් කර ඇති මූල්‍ය කාර්‍ය සාධනය පිළිබඳ ප්‍රකාශය ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ ගිණුම්කරණ පොත්,වාර්තා සහ අනෙකුත් සියලුම ගිණුම්කරණ තොරතුරු වලට අනුකූලව පිළියෙල කර ඇත.

මූල්‍ය ප්‍රකාශ සඳහා වූ සටහන් මූල්‍ය ප්‍රකාශනයන්හි කොටසක් වේ.

අත්සන් කළේ ??????
එස් හෙට්ටිආරච්චි
අතිරේක ලේකම්
ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය
සාමාජික, කළමණාකරණ මණ්ඩලය
ආසේඅමාවි

අත්සන් කළේ ??????
ජේ සී රඹුක්පොත ආර්එස්පී යූඑස්පී
මේජර් ජෙනරාල්
සේනාවිධායක
ආසේඅමාවි

අත්සන් කළේ ???
එච්එම්එන් දර්ශන
ගණකාධිකාරී
ආසේඅමාවි

අත්සන් කළේ ???
ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී
ලේකම්, ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය
සභාපති කළමණාකරණ මණ්ඩලය
ආසේඅමාවි

**ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය - සපුගස්කන්ද**
**2012 වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය**

| 2012.12.31 දිනට | සටහන් | 2012 රු. | 2011 රු. |
|---|---|---|---|
| රජයේ ප්‍රධාන | | 102,865,139 | 95,000,000 |
| වෙනත් ප්‍රධාන | 11 | 37,961,533 | 31,220,605 |
| **මුළු ආදායම** | | **140,826,672** | **126,220,605** |
| | | | |
| **වියදම** | | | |
| පුද්ගල සංවේතන | | 28,237,064 | #REF! |
| පාරිතෝෂික හා සැපයුම් | | 331,121,621 | #REF! |
| නඩත්තු වියදම් | | 14,432,467 | #REF! |
| ගිවිසුම්ගත සේවාවන් | | 33,909,604 | #REF! |
| | | | |
| **මුළු වියදම** | 12 | **109,691,297** | **#REF!** |
| | | | |
| කපයවීම් ගැලපීමට පෙර මෙහෙයුම් අතිරික්තය/ (ඌනතාවය) | | 31,135,375 | #REF! |
| ක්ෂයවීම් | | | |
| යන්ත්‍ර පිරියත උපකරණ ඉවත් කිරීමේ අලාභය | 13 | (2,160,000) | - |
| වර්ෂයේ ක්ෂය | 14 | (35,385,411) | (29,392,508) |
| | | | |
| **වර්ෂයේ ශුද්ධ ඌනතාවය** | | **(6,410,036)** | **(2,017,213)** |

මූල්‍ය ප්‍රකාශ සඳහා වූ සටහන් ප්‍රකාශනයන් හි කොටසක් වේ.

**ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය - සපුගස්කන්ද**
**2012.12.31 න් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය**

| | සමුච්චිත අරමුදල<br>රු. | තැන්පතු ගිණුම<br>රු. | වෙනත් ප්‍රතිපාදන (මූල ධන)<br>රු. |
|---|---|---|---|
| **2011.01.01 දිනට ශේෂය** | **451,910,711** | - | |
| වැඩිවීම් (අඩුවීම්) | 144,573,584 | 1,347,246 | 20,513,175 |
| වර්ෂයේ අඩුවීම් | - | - | - |
| ඌනතාවය (වර්ෂය සඳහා ශුද්ධ අලාභය) | (2,017,213) | | |
| **2012.01.01 දිනට ශේෂය** | **594,467,082** | **1,347,246** | **20,513,175** |
| වර්ෂයේ වැඩිවීම් | 83,821,398 | 929,385 | 14,033,900.00 |
| වර්ෂයේ අඩුවීම් | (82,453,859) | (155,676) | - |
| ඌනතාවය | (6,410,036) | | - |
| **2012.12.31 දිනට ශේෂය** | **589,424,585** | **2,120,955** | **34,547,075** |

මූල්‍ය ප්‍රකාශ සඳහා වූ සටහන් මූල්‍ය ප්‍රකාශනයන්හි කොටසක් වේ.

**ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය - සපුගස්කන්ද**
**2012 වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | 2012<br>රු. | 2011<br>රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරම් වලින් වූ මුදල් ප්‍රවාහය** | | |
| ලැබීම් | 103,698,970 | #REF! |
| රජයේ ප්‍රධාන (පුනරාවර්තන) | 102,865,139 | 95,001,557 |
| වෙනත් ප්‍රධාන - (පුනරාවර්තන) | 833,831 | #REF! |
| වියදම් | (103,656,659) | (97,726,328) |
| පුද්ගල සවේතන | (28,192,028) | (25,423,989) |
| සැපයුම්කරුවන්ට ගෙවීම් | (32,775,114) | (28,500,501) |
| නඩත්තු සඳහා වියදම් | (10,245,291) | (12,735,038) |
| ගිවිසුම්ගත සේවාවන් සඳහා වියදම් | (32,444,227) | (31,066,800) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | 42,311 | (286,900) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය** | | |
| ස්ථාවර වත්කම් අත්පත් කරගැනීම් | (21,610,475) | (14,115,592) |
| සංවර්ධන වියදම් | (97,577,031) | (63,529,669) |
| තැන්පතු ගිණුමට මාරුකිරීම් | (884,349) | (1,051,654) |
| ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | (120,071,854) | (78,696,915) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය** | | |
| රජයේ ප්‍රධාන - (මූලධන) | 120,091,158 | 78,527,772 |
| වෙනත් ප්‍රධාන - (මූලධන) | | 164,071 |
| මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | 120,091,158 | 78,691,843 |
| **මුදල් හා මුදල් වලට සමාන දෑ හි සිදු වූ ශුද්ධ වෙනස** | **61,615** | **(291,972)** |
| 2012.01.01 දින මුදල් හා මුදල් සමාන දෑ | 10,266 | 302,238 |
| **2012.12.31 දිනට මුදල් හා මුදල් සමාන දෑ** | **71,881** | **10,266** |

මූල්‍ය ප්‍රකාශ සඳහා වූ සටහන් මූල්‍ය ප්‍රකාශනයන්හි
කොටසක් වේ.

1. <u>ගිණුම්කරණ ප්‍රතිපත්ති</u>

අ. <u>වාර්ථාකරන ලබන ආයතනය</u>.

(1) ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය, 2008 පෙබරවාරි 19 වන දින සම්මත කරන ලද 2008 අංක 05 දරණ පාර්ලිමේන්තු පනත මගින් 2007 ජූනි මස 22 දින ස්ථාපිත කරන ලදී. මෙය එවකට පැවති යුද හමුදා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ අනුප්‍රාප්තිකයායි. යුද හමුදා අණ සහ මාණ්ඩලික විද්‍යාලය 1998 මාර්තු මස 16 වන දින ස්ථාපිත කරන ලද ආයතනයක් වේ.

(2) විද්‍යාලය සපුගස්කන්ද මාකොල ප්‍රදේශයේ පිහිටා ඇත.

(3) ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය ස්වාධින ආයතනයක් ලෙස පිළිගෙන මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරිමෙන් අනතුරුව ප්‍රථම වරට 2010 දි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලදි.

ආ. <u>මූලික කාර්‍යයන්</u>. විද්‍යාලයේ මූලික කාර්‍යයන් පහත සඳහන් පරිදි වේ.

(1) විද්‍යාලයේ අධ්‍යන පාඨමාලා හැදෑරිම සඳහා ත්‍රිවිධ හමුදා නිලධාරින්, පොලිස් නිලධාරින්, රාජ්‍ය අයතනවල නිලධාරින් හා විදේශ හමුදා නිලධාරින් ඇතුලත් කර ගැනිම.

(2) ශිෂ්‍ය නිලධාරින් ඇගයිම සඳහා විභාග පැවැත්විම.

(3) අධ්‍යන පාඨමාලා සාර්ථකව හැදෑරූ ශිෂ්‍ය නිලධාරින් වෙත සහතිකපත් නිකුත් කිරිම සහ පිඑස්සි (psc) නිල නාමය ප්‍රධානය කිරිම.

ඇ. <u>පිළියෙල කිරිමේ පදනම</u>.

(1) <u>අනුකූලතා ප්‍රකාශය</u>. මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්‍යසාධනය පිළිබඳ ප්‍රකාශය, ස්කන්ධගේ වෙනස්විම්, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනයන්ට සටහන් වලින් විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන සමන්විත වේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ අංක (SLAS) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (SLPASAS) වලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලදි.

ශ්‍රී ලංකා ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරන ලද 2012.01.01 දි හෝ එදිනට පසු ආරම්භ වන මූල්‍ය කාලච්ජේදයන් සඳහා අදාල වන නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතින් වන LKAS සහ SLFRS යන්ට අනුකූලව පිළියෙල කර ඉදිරිපත් කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශනයන් මගින් ප්‍රථමවරට SLFR - 1 වලට අනුව පිළියෙල කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශනයන් ඉදිරිපත් කරයි.

(2) <u>මිනුම් දඬු සඳහා පදනම</u>. මූල්‍ය ප්‍රකාශ හා විද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම යන පදනම මත පිළියෙල කර ඇති අතර, ගිණුම්කරණ ප්‍රතිපත්ති මුළු කාල පරිච්ජේදය පුරාවටම ඒකාකාරිව උපයෝගී කර ගෙන ඇත. මූල්‍ය ප්‍රකාශනයන්හි උද්ධමනකාරි බලපැම් සඳහා ගැලපුම් කර නොමැත.

(3) <u>භාවිතා කරන සහ ඉදිරිපත් කිරිමේ මුදල් ඒකකය</u>. මෙම මූල්‍ය ප්‍රකාශන විද්‍යාලයේ භාවිතා වන මුදල් ඒකකය වන ශ්‍රිලංකා රුපියල් වලින් පිළියෙල කර ඇත.

ඇ. <u>වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති</u>

(1) **<u>දේපල, පිරියත හා උපකරණ</u>**

(අ) **<u>හඳුනා ගැනීම හා මිනුම් දඬු</u>**

i. දේපල, පිරියත හා උපකරණ මුල් පිරිවැය හෝ ප්‍රත්‍යාගනක්පන අගයෙන් ක්පයවීම් අඩුකර දක්වා ඇත. 2010 වර්ෂය ප්‍රථම මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කිරීම සඳහා දේපල පිරියත හා උපකරණ 2009.12.31 දිනට ප්‍රත්‍යාගනනය කරන ලදී. වටිනාකමේ තක්සේරුව සුදුසුකම්ලත් පුද්ගලයින් විසින් එළදායි ක්ෂයවීම් අනුපාත හා වෙළඳ වටිනාකම සැලකිල්ලට ගෙන සිදුකර ඇත.

ii. විද්‍යාලයට පැහැදිලි හිමිකමක් නැති දේපල පිරියත හා උපකරණ වල ප්‍රත්‍යාගණනය කර නොමැති අතර, ගිණුම් වලටද ගෙන නැත. කෙසේවෙතත්, රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා යුධ හමුදාව විසින් ලබාදී ඇත. වාහනවල අයිතිය එම ආයතනයන්ට අයත් වුවත්, එහි ප්‍රතිලාභ හා වියදම් විද්‍යාලය සතු බැවින් දේපල, පිරියත හා උපකරණ යටතේ දක්වා ඇත. එම වාහනවල අයිතිය විද්‍යාලය වෙත පවරා ගැනීමට කටයුතු සිදුකරමින් පවතී. ඉඩම් අත්පත් කර ගැනීම සඳහා ගෙවා ඇති අත්තිකාරම් මූල්‍ය ප්‍රකාශනයන්හි දේපල, පිරියත හා උපකරණ වශයෙන් දක්වා ඇත.

iii. දේපල, පිරියත හා උපකරණ වල පිරිවැයට එය අත්පත් කරගැනීමට හෝ ඉදිකිරීමට අදාල පිරිවැය සහ එම වත්කම් භාවිතා කලහැකි මට්ටමට ගෙන ඒම සඳහා දරණ ලද සියළු වියදම් ඇතුලත්ව ඇත.

iv. 2012 මූල්‍ය ප්‍රකාශනයන්හි පරිගණක හා උපාංග වෙන වෙනම අයිතමයන් ලෙස වර්ගීකරණය කර ඇති අතර, ඊට අනුකූලව 2011.12.31 දිනට දේපල පිරියත හා උපකරණ වල පිරිවැය හා ක්ෂය කාලය ගලපන ලදී.

(ආ) **<u>ක්ෂයවීම්</u>.**

i. දේපල, පිරියත හා උපකරණ වල පිරිවැය මත පහත සඳහන් ක්ෂය අනුපාතයන් යටතේ කපය වෙන්කිරීම් කර ඇත.

| | |
|---|---|
| ගොඩනැගිලි | 2% |
| යන්ත්‍රෝපකරණ | 12.5% |
| ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 20% |
| වාහන | 20% |
| පරිගණක සහ උපකරණ | 20% |

ii. මූල්‍ය කාර්‍යසාධන ප්‍රකාශයේ ක්ෂයවීම් දේපල පිරියත හා උපකරණ වල ඇස්තමේන්තු ගත ආයුකාලය අනුව සරල මාර්ග ක්‍රමය යටතේ ක්ෂයවීම් හඳුනාගෙන ඇත. ඉඩම් සහ කෙරිගෙන යන වැඩ සඳහා ක්ෂය වීම් ගණනය කර නොමැත. වර්ෂය තුල මිලදීගත් /ඉදිකරන ලද සියළු දේපල, පිරියත හා උපකරණ සඳහා ක්ෂයවීම් වෙන්කර ඇත.

iii. වර්ෂය තුලදී ඉවත් කරන ලද දෙපල පිරියත සහ උපකරණ සඳහා ක්ෂයවීම් ගණනය කර නොමැත.

(ඇ) **ඉවත් කිරිම්**

දේපල පිරියත හා උපකරණ ඉවත් කිරිමේදි පැන නගින ලාබ හෝ අලාභ එම අයිතම ඉවත් කරන වර්ෂයේදි විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ඇතුලත් කර ඇත.

ඉවත් කරන ලද දේපල පිරියත හා උපකරණ වල පිරිවැය හා සමුච්චිත ක්ෂය මූල්‍ය ප්‍රකාශන වලින් ඉදිරිපත් කර ඇත.

(2) **රජයේ ප්‍රධාන සඳහා ගිණුම් තැබීම**

අ. පුනරාවර්ථන ප්‍රධාන මූල්‍ය කාර්‍ය සාධන ප්‍රකාශයේ ආදායම් වශයෙන් සලකා ඇත.

ආ. මූලධන වත්කම් අත්පත් කර ගැනිම් හා වැඩිදියුණු කිරිම වෙනුවෙන් ලබාදෙන ලද මූලධාන ප්‍රාධාන සමුච්චිත අරමුදලට ආදායම් වශයෙන් සලකා ඇති අතර, වත්කමවල ජීව කාලය තුලදී එම ප්‍රධානයන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයන්ට හඳුනාගනු ලැබේ.

ඇ. රජයෙන්/රජය අනුබද්ධ ආයතන වලින් වර්ෂය තුලදි විද්‍යාලයට ලැබුණු මූල්‍ය නොවන ප්‍රධානයන්හි වටිකානම වත්කම් හා ප්‍රධාන ලෙස මූල්‍ය ප්‍රකාශනයන්හි දන්වා ඇත.

(3) **මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

අ. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 අනුව ඍජු ක්‍රමය භාවිත කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර ඇත.

ආ. වර්ෂය තුලදි මූල්‍ය නොවන ප්‍රධාන ලෙස ලැබුණු ප්‍රදානයන් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරිමේදි ඇතුලත් නොකරන ලදි.

(4) **වගකීම් හා වෙන්කිරිම්** මූල්‍ය ප්‍රකාශය පිළියෙළ කිරිමේදි සියළු හඳුනාගත් වගකිම් ගිණුම්ගත කර ඇත.

(5) **ආදායම් හඳුනාගැනීම** විද්‍යාලයේ ආදායම් යන්නට පුනරාවත්තන ස්වභාවයේ රජයේ ප්‍රධාන හා අනෙකුත් ප්‍රධාන ඇතුලත් වේ. සියළු ආදායම් හා වියදම් උපචිත පදනම අනුව හඳුනා ගෙන ඇත.

(6) **සේවක ප්‍රතිලාභ** නිශ්චිත ලද දායකත්ව සැලසුම නිශ්චිත දායකත්ව සැලසුම සඳහා ඇති බැඳීම මූල්‍ය කාර්‍යසාධන ප්‍රකාශයේ වියදමක් ලෙස හඳුනාගෙන ඇත. සිවිල් සේවකයින් ගේ වේතනයෙන් 12% ක් දායකත්වයක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට විද්‍යාලය විසින් සපයනු ලැබේ.

(7) **අනෙකුත් මෙහෙයුම් නොවන වියදම්** මූල්‍ය කාර්‍යසාධක ප්‍රකාශයේ අතිරික්තය/ ඌනතාවය ගණනය කිරීමේදී විද්‍යාලය පවත්වාගෙන යාම සඳහා වූ සියළු වියදම් මෙන්ම මූලධන වත්කම් නඩත්තු සඳහා වූ වියදම්ද සලකා ඇත.

(8) **සංසන්දනාත්මක තොරතුරු**. සමාලෝචිත වර්ෂයේ ඉදිරිපත්කිරීම් හා සැසඳීම් කළහැකි වන පරිදි සංසන්දනාත්මක සංඛ්‍යාවන් අවශ්‍ය පරිදි ඉදිරිපත් කර ඇත.

(9) **මූල්‍ය තත්ව ප්‍රකාශනයේ දිනට පසු සිදුවීම්**. මූල්‍ය තත්ව ප්‍රකාශයේ දිනට පසුව සිදුවූ ප්‍රමාණාත්මක සිදුවීම් සඳහා අවශ්‍ය පරිදි ගැලපීම් නිසි මූල්‍ය ප්‍රකාශනයන්හි සිදුකර ඇත.

**සටහන 02: දේපළ, යන්ත්‍ර සහ උපකරණ**

| විස්තරය | වියදම/වටිනාකම | | | |
|---|---|---|---|---|
| | 01.01.2012 දිනට ශේෂය | වර්ෂය තුළ නවාංග සහ සංවර්ධනය | වර්ෂය තුළ හමාර කිරිම | 31.12.2012 දිනට වටිනාකම |
| ඉඩම් | 104,500,000 | - | | 104,500,000 |
| ගොඩනැගිලි | 381,646,645 | 78,672,591 | - | 460,319,236 |
| යන්ත්‍ර සූත්‍ර | 35,922,149 | 13,140,112 | - | 49,062,261 |
| වාහන | 40,921,500 | 14,000,000 | (3,600,000) | 51,321,500 |
| ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ | 18,716,454 | 7,609,095 | - | 26,325,549 |
| කෙරෙමින් පවතින් වැඩ | 13,794,332 | 8,790,339 | - | 22,584,671 |
| | 4,206,593 | 24,261,795 | | 28,468,387 |
| | 599,707,671 | 146,473,933 | (3,600,000) | 742,581,604 |

| විස්තරය | වියදම/වටිනාකම | | | |
|---|---|---|---|---|
| | 01.01.2012 දිනට ශේෂය | වර්ෂය සඳහා | වර්ෂය තුළ | 31.12.2012 දිනට වටිනාකම |
| ඉඩම් | - | - | - | - |
| ගොඩනැගිලි | 13,883,210 | 9,206,385 | - | 23,089,595 |
| යන්ත්‍ර සූත්‍ර | 8,357,212 | 6,132,683 | - | 14,489,894 |
| වාහන | 14,888,600 | 10,264,300 | (1,440,000) | 23,712,900 |
| ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ | 6,144,353 | 5,265,110 | - | 11,409,462 |
| කෙරෙමින් පවතින් වැඩ | 4,711,678 | 4,516,934 | - | 9,228,612 |
| | - | - | - | - |
| | 47,985,052 | 35,385,411 | (1,440,000) | 81,930,464 |

| | |
|---|---|
| ලිඛිත වටිනාකම- 31.12.2012 | **660,651,140** |
| ලිඛිත වටිනාකම- 31.12.2011 | 551,722,619 |

**සටහන 3 : තොගය**

| | රු |
|---|---|
| ලිපි ද්‍රව්‍ය | 2,282,128 |
| වෙනත් ආසේඅමාවි තොග | 825,798 |
| යුධ හමුදාව වෙතින් ලැබීම් | 699,887 |
| | **3,807,813** |

**සටහන 4 : පෙර ගෙවුම්**

| | රු |
|---|---|
| ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් - වාහන රක්ෂණ | 47,320 |
| ජාතික රක්ෂණභාර අරමුදල - වාහන රක්ෂණය | 202,140 |
| | **249,460** |

**සටහන 5 : මුදල් සහ මුදල් හා සමාන දෑ**

| | රු |
|---|---|
| මූලධන ඉතුරුම් | 24,466 |
| ප්‍රාග්ධන ඉතුරුම් | 47,415 |
| | **71,881** |

**සටහන 6 : සමුච්චිත අරමුදල**

| | රු |
|---|---|
| 2012.01.01 දිට ඉතිරිය | 594,467,082 |
| රාජ්‍ය මූල්‍යධනය (ආදායම) | 83,821,398 |
| ගැලපීම් 1 | (82,453,859) |
| 2012 සඳහා හිගය | (6,410,036) |
| 2012.12.31 දිනට ශේෂය | **589,424,584** |

ගැල්පීම් 1

තැන්පත් ගිණුම් මගින් ණය ගෙවීම් හා රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යංශය වෙතින් ලබාදී ඇති දේපළ , යන්ත්‍රසූත්‍ර හා උපකරණ වල වටිනාකම සමුච්චිත අරමුදලට ගලපා ඇත.

**සටහන 7 : තැන්පත් ගිණුම**

| | රු |
|---|---|
| 2012.01.01 දිට ආරම්භක ශේෂය | 1,347,246 |
| වර්ෂය තුල ගෙවීම් | (155,676) |
| පුනරාවර්ථන වියදම් සඳහා මාරු කරන ලදි | 45,036 |
| මූල්‍යධන වියදම් සඳහා මාරු කරන ලදි | 884,349 |
| | **2,120,955** |

**සටහන 8 : වෙනත් මූලධන**

| | රු |
|---|---:|
| 2012.01.01 දිනට ශේෂය | 20,513,175 |
| පුද්ගල සංවේතන රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වෙතින් ලැබීම් | 8,400,000 |
| පුද්ගල සංවේතන යුධ හමුදාව වෙතින් ලැබීම් | 5,633,900 |
| 2012.12.31 දිනට ශේෂය | **34,547,075** |

**පුද්ගල සංවේතන රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වෙතින් ලැබීම්**

රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වෙතින් රු.මි. 8.4 ක් වටිනා වාහන 2 ක් විද්‍යාලයට ලබාදී ඇත.

**පුද්ගල සංවේතන යුධ හමුදාව වෙතින් ලැබීම්**

යුධ හමුදාව වෙතින් රු.මි 5.63 වටිනා ටාටා ස්ටාර් බස් රථයක් විද්‍යාලයට ලබාදී ඇත.

**සටහන 9 : එකතුවන වියදම්**

| | රු |
|---|---:|
| සංනිවේදන | 226,837 |
| විදුලිය | 2,480,155 |
| ජලය | 657,904 |
| කුලී හා බදු මුදල | 204,867 |
| | **3,569,762** |

**සටහන 10 : අනියම් ණයකරු**

| | රු |
|---|---:|
| පුද්ගල වේතන | 350,152 |
| සැපයුම් හා පරිභෝජන | 25,303,958 |
| නඩත්තු සේවා | 2,175,498 |
| ගිවිසුම්ගත සේවා | 859,599 |
| වෙනත් ඉදිකිරීම් | 6,428,711 |
| | **35,117,917** |

**සටහන 11 : වෙනත් ලැබීම්**

| | රු |
|---|---:|
| යුධ හමුදා වෙතින් ලැබුණ ලිපි ද්‍රව්‍ය | 725,975 |
| යුධ හමුදා වෙතින් ලැබුණ වෙනත් ද්‍රව්‍ය | 1,016,316 |
| රාජ්‍ය මුල්‍ය ධනය වෙතින් ලැබීම් | 35,385,411 |
| වෙනත් ලැබීම් | 833,831 |
| | **37,961,532** |

## සටහන 12 : වියදම්

| | රු |
|---|---|
| **පුද්ගල වේතන** | **28,237,064** |
| වැටුප් සහ දීමනා | 22,213,220 |
| වෙනත් දීමනා | 4,119,684 |
| අතිකාල | 1,904,160 |
| | |
| **සැපයුම් හා පරිභෝජන** | **33,112,162** |
| ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 4,277,535 |
| තෙල් හා ඉන්ධන | 18,095,892 |
| සංග්‍රහ | 4,487,099 |
| පුවත්පත් | 139,250 |
| උපාධි ප්‍රධානෝත්සවය | 6,112,385 |
| | |
| **නඩත්තු වියදම්** | **14,432,467** |
| වාහන | 3,681,879 |
| යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 3,525,022 |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් | 6,352,984 |
| තොරතුරු තාක්ෂණය | 872,582 |
| | |
| **ගිවිසුම්ගත සේවා** | **33,909,604** |
| දුරකථන | 1,741,272 |
| විදුලිය | 21,771,135 |
| ජලය | 6,307,646 |
| කුලී හා බදු මුදල් | 2,063,667 |
| සනීපාරක්ෂක | 326,020 |
| දේශණ හා වෙනත් | 1,699,864 |
| | |
| | **109,691,297** |

## සටහන 13 : වියදම්

යුධ හමුදාව විසින් විද්‍යාලට සපයා තිබූ පහත සඳහන් වාහන අයෝග්‍ය කරන ලදි

රු

| වාහන අංකය | වර්මාන අගය රු | වටිනාකම රු | ලාභ/අලාභ රු |
|---|---|---|---|
| යුහ 7291 | - | 465,000 | (465,000) |
| යුහ 2181 | - | 390,000 | (390,000) |
| යුහ 4299 | - | 330,000 | (330,000) |
| යුහ 7287 | - | 480,000 | (480,000) |
| යුහ් 7250 | - | 495,000 | (495,000) |
| | | 2,160,000 | **(2,160,000)** |

**සටහන 14 : ක්ෂය කිරීම්**

| | Rs |
|---|---:|
| ගොඩනැගිලි හා ඉදිකිරීම් | 9,206,385 |
| යන්ත්‍රසූත්‍ර | 6,132,683 |
| වාහන | 10,264,300 |
| ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ | 5,265,110 |
| පරිගණක හා උපාංග | 4,516,934 |
| **2011 වර්ෂය සඳහා ක්ෂය කිරීම්** | **35,385,411** |

**ඇමුණුම ඇ**
**වාර්ෂික වාර්ථාව - 2012**

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
# கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
# AUDITOR GENERAL'S DEPARTMENT

| | | |
|---|---|---|
| මගේ අංකය / எனதுஇல / My No. ඕඊ/ඩී/ඩීඑස්සීඑස්සී/ එෆ්ජ්/2012/07 | ඔබේ අංකය / உமது இல / Your No. | දිනය / திகதி / Date 2014 පෙබරවාරි 17 දින |

සභාපති,

ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය

ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

යථෝක්ත වාර්තාව මේ සමග එවා ඇත.

එච්.ඒ.එස්.සමරවීර
විගණකාධිපති

පිටපත්- 1. ලේකම් - මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
2. ලේකම් - රාජ්‍ය ආරක්ෂක.හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය

අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone. 2887028 - 34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. oaggov@sltnet.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனதுஇல / My No. : ඩීඑෆ්/ඩී/ඩීඑස්සීඑස්සී/එෆ්ඒ/2012/07

ඔබේ අංකය / உமது இல / Your No. :

දිනය / திகதி / Date : 2014 පෙබරවාරි 17 දින

සභාපති,

ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය

ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2008 අංක 05 දරන ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාල පනතේ 21(2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් විද්‍යාලයේ සභාපති වෙත 2013 ජූලි 19 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone. : 2887028 - 34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. : 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. : oaggov@sltnet.lk

1.3 **විගණකගේ වගකීම**

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 **තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

---------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

---------------

2.1 තත්ත්වාගණනය කළ මතය

------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විද්‍යාලයට අයත් නොවන වාහන, මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීම

------------------------------------------------------------------------

(i) විද්‍යාලය මගින් පරිහරණය කෙරෙන , එහෙත් ආරක්ෂක අමාත්‍යාංශයට හා යුධ හමුදාවට අයත් එකතුව රු.51,321,500 ක පිරිවැය වූ වාහන, මාණ්ඩලික විද්‍යාලයේ ජංගම නොවන වත්කම් ලෙස ගිණුම්ගත කිරීම නිසා එම වත්කම් හා සමුච්චිත අරමුදල රු. 51,321,500 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ii) හිමිකමක් නැති වාහනවල ක්ෂය, ගිණුම්වලට ගැලපීම නිසා ක්ෂය වෙන් කිරීම් රු.23,712,900 ක් වැඩියෙන් දක්වා තිබූ අතර සමුච්චිත අරමුදල රු.13,448,600 ක් අඩුවෙන්ද වර්ෂයේ අලාභය රු.10,264,300 ක් වැඩියෙන්ද දක්වා තිබුණි.

(iii) විද්‍යාලය මගින් පරිහරණය කෙරෙන එහෙත් යුධ හමුදාවට අයත් වාහන අපහරණය කිරීමේදී සිදුවූ රු.2,160,000 ක අලාභය ගිණුම්වලට ගැලපීම නිසා සමාලෝචිත වර්ෂයට අදාල අලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) තැන්පතු ගිණුම

කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු රැඳවුම් මුදල් හා කාර්ය මණ්ඩල වැටුප් රහිත නිවාඩු වලට අදාලව කරන ලද අඩුකිරීම් ජංගම නොවන වගකීම් යටතේ තැන්පතු ගිණුමට බැරකර තිබුණි. 2010 පෙබරවාරි මස සිට 2012 ජනවාරි මස දක්වා වැටුප් රහිත නිවාඩු වශයෙන් අඩුකර තිබූ රු.340,628 ක් ඉහත තැන්පතු ගිණුමට බැර කිරීම නිසා ජංගම නොවන වගකීම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

## 2.2.2 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 8 (1) වගන්තිය | සෑම මුදල් වර්ෂයක් සඳහාම අයවැය ලේඛනයක් පිළියෙල කොට අදාල මුදල් වර්ෂය ආරම්භ වීමට මාස තුනකට පෙර පාලක මණ්ඩලය විසින් අනුමත කළ යුතු වුවත් 2012 වර්ෂයේ අයවැය ලේඛනය 2013 පෙබරවාරි 27 දින අනුමත කර තිබුණි. |
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.1 වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය ලේඛනයේ අයවැයගත ශේෂපත්‍රය, අයවැයගත ආදායම් සහ වියදම් ප්‍රකාශය හා අයවැයගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඇතුළත් කර නොතිබුණි. |

3 මූල්‍ය සමාලෝචනය

---------------------

3.1 මූල්‍ය ප්‍රතිඵලය

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂය සඳහා මෙහෙයුම්වලින් ජනනය වූ මූල්‍ය ප්‍රතිඵලය රු.6,410,036 ක ඌනතාවයක්වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.2,017,213 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.4,392,823 ක පිරිහීමක් නිරීක්ෂණය විය.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-----------------------------------

මූල්‍ය ප්‍රතිඵලයේ රු.4,392,823 ක පිරිහීම සඳහා පසුගිය වර්ෂයට සාපේක්ෂව සමහර වියදම් රු.22,844,365 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

4 මෙහෙයුම් සමාලෝචනය

----------------------------

4.1 කාර්යසාධනය

----------------

මාණ්ඩලික විද්‍යාලය විසින් මෙහෙයවනු ලබන උපාධි පාඨමාලාවට සමාලෝචිත වර්ෂයේ සහභාගි වූ සිසුන් සංඛ්‍යාව 102 ක් වූ අතර ඊට සාපේක්ෂව ඉකුත් වර්ෂයේ සහභාගී වූ සිසුන් සංඛ්‍යාව 83 ක් විය. විස්තීරණ ආදායම් ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයේ මුළු වියදම රු.145,076,708 ක්වූ අතර ඒ අනුව එක් උපාධිධාරියෙකු වෙනුවෙන් රු.1,422,321 ක පිරිවැයක් දරා තිබුණි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගබඩා භාණ්ඩ පරීක්ෂාව

-----------------------------

(i) තොග පොත් ගබඩාවෙන් පිටස්තරව පවත්වා නොතිබුණු නිසා 2012 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ දක්වා තිබූ තොග ශේෂයේ නිරවද්‍යතාවය තහවුරු කළ නොහැකි විය.

(ii) විද්‍යාලයේ එක් එක් අංශවල භාවිතයට ගන්නා වත්කම් පිළිබඳ විස්තර ඇතුළත් කිරීම සඳහා වෙනම ඉන්වෙන්ට්‍රි ලේඛන නඩත්තු කර නොතිබුණි.

4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

(අ) 2011 වර්ෂයේදී ඇස්තමේන්තු ගත පිරිවැය රු.මිලියන 64 ක් ලෙස නිශ්චය කරමින් විද්‍යාලයේ සිව්මහල් සින්ඩිකේට් ගොඩනැගිල්ල නාවික හමුදාවේ අධීක්ෂණය යටතේ බාහිර කොන්ත්‍රාත්කරුවෙකු ලවා ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. ඉන් රු.මිලියන 46.2 ක ප්‍රතිපාදන 2011 වසරේ නාවික හමුදාවට ලබා දී තිබුණද, වැය කර තිබුණේ රු.මිලියන 4.2 ක් පමණි. 2011 වර්ෂය අවසානයේදී රු.මිලියන 42 ක් නැවත භාණ්ඩාගාරයට බැර කර තිබුණි.

(ආ) 2012 වර්ෂයේදීද විද්‍යාලයේ ප්‍රතිපාදනවලින් රු.මිලියන 17.8 ක් මෙම ඉදිකිරීම වෙනුවෙන් ලබාදී තිබුණි. එහෙත් එම වර්ෂය අවසාන වන විටත් ඉදිකිරීම් කටයුතු නිමවී නොතිබූ අතර මිළගණන් වැඩිවීම හා කාලප්‍රමාදය නිසා මුල් ඇස්තමේන්තුව රු.මිලියන 86.5 දක්වා වැඩිකර තිබුණි. තවද ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීම නිසා 2013 වර්ෂයේදී ආරම්භ කිරීමට නියමිත පාඨමාලා අපේක්ෂිත මට්ටමින් පුළුල් කළ නොහැකි වී තිබුණි.

4.4 අරමුදල් ඌන උපයෝජනය

------------------------------

වාර්ෂිකව මහා භාණ්ඩාගාරය විසින් ලබාදුන් ප්‍රාග්ධන ප්‍රතිපාදන විද්‍යාලය මගින් උපයෝජනය කර නොගැනීම හේතුවෙන් වර්ෂ අවසානයේ නැවත භාණ්ඩාගාරය වෙත බැරවීම අඛණ්ඩව සිදුවී තිබුණි. එලෙස 2010, 2011 හා 2012 වර්ෂ අවසානයේදී පිළිවෙලින් රු.මිලියන 27.2 ක්, රු.මිලියන 55.7 ක් හා රු.මිලියන 16.8 ක් ප්‍රයෝජනයට නොගෙන භාණ්ඩාගාරයට බැර කර තිබුණි.

4.5 වාහන උපයෝජනය

--------------------

විද්‍යාලය සඳහා ආරක්ෂක අමාත්‍යාංශය මගින් වාහන 17 ක් හා යුද්ධ හමුදාව මගින් වාහන 14 ක් ලබා දී තිබූ අතර මෙම වාහනවල අයිතිය විද්‍යාලය වෙත පවරා නොතිබුණි. ත්‍රීවිල් රථයක් 2011 දෙසැම්බර් 17 දින සිට ගර්හිතව නිකරුනේ ගාල්කර තිබුණි. විද්‍යාලය භාවිතා කරන වාහන එකම අංශයකින් පාලනය කළයුතු වුවත් යුද්ධ හමුදාව හා ආරක්ෂක අමාත්‍යාංශයේ වාහන ප්‍රවාහන අංශයෙන්ද ගුවන් හමුදාව මගින් සැපයූ වාහන 04 ක් හා නාවික හමුදාව මගින් සැපයූ වාහන 02 ක් ඔවුන්ගේ ඒකක (Wing) මගින්ද පාලනය වන පරිදි පාලන කටයුතු විමධ්‍යගත කර තිබුණි.

4.6 සේවක මණ්ඩල කළමනාකරණය

විද්‍යාලයේ අනුමත සේවක සංඛ්‍යාව 100 ක් වුවද සේවයේ යෙදී සිටි සේවක සංඛ්‍යාව 92 ක් විය.

5 ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය

5.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

2012 වර්ෂයට අදාලව විද්‍යාලයේ පුනරාවර්තන වියදම් සඳහා රු.103,000,000 ක හා ප්‍රාග්ධන වියදම් සඳහා රු.200,000,000 ක ප්‍රතිපාදන ලැබී තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළදී එයින් පුනරාවර්තන වියදම් ලෙස රු.109,691,297 ක්ද ප්‍රාග්ධන වියදම් ලෙස රු.146,473,933 ක්ද වැය කර තිබුණි. මේ පිළිබඳ මූල්‍ය ඉලක්කයන් හා භෞතික ඉලක්කයන් ඒ ඒ කාලවකවානු අනුව හඳුනාගත හැකි වන පරිදි ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර නොතිබුණි. ක්‍රියාකාරි සැලැස්ම සමග සංසන්දනය කළ හැකි වන පරිදි කාර්යසාධන වාර්තා පිළියෙල කර නොතිබුණි.

5.2 අයවැය ලේඛනමය පාලනය

ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය හා තථ්‍ය වියදම අතර සැලකිය යුතු විචලනයක් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

5.3 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 6.5.3 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂයක් අවසාන වී දින 150 ක් ඇතුළත ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තාව හා ගිණුම් පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2010 හා 2011 වර්ෂ සඳහා වාර්ෂික වාර්තා 2013 නොවැම්බර් 9 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

6 **පද්ධති හා පාලනයන්**

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ සභාපතිවරයා වෙත වරින් වර දැනුවත් කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

(අ) ප්‍රාග්ධන ප්‍රතිපාදන උපයෝජනය

(ආ) සේවක මණ්ඩල පාලනය

(ඇ) ඉදිකිරීම් කටයුතු

(ඈ) ගබඩා පාලනය

එච්.ඒ.එස්.සමරවීර

විගණකාධිපති

**ඇමුණුම ඉ**
**වාර්ෂික වාර්තාව - 2012**

## කාර්ය සාධක දර්ශකය (Key Performance Indicator )

| අ/අංකය S/No | කාර්ය සාධක දර්ශකය (Key Performance Indicator ) | කාර්ය සාධක මිණුම් (Measurement) | ලගා වු ඉලක්කයන් (Target/Milestone reached) |
|---|---|---|---|
| 01 | අධ්‍යාපනික දර්ශකයන් **(Academic Indicator)**<br><br>අ. ශිෂ්‍ය සහභාගිත්ව දර්ශකය. (Student Participation Indicator) | | |
| | | අ. ත්‍රිවිධ හමුදා ශිෂ්‍ය සහභාගිත්වය 120 දක්වා වර්ධනය කිරීම. | අ. 2011 වර්ෂය තුල ශිෂ්‍ය සහභාගිත්වය 82 වු අතර එය 2012 වර්ෂයේදි ශිෂ්‍යයින් 102 දක්වා වර්ධනය විය. |
| | | ආ. මාණ්ඩලික පාඨමාලාව සමත් විම ප්‍රතිශතය උපරිමය දක්වා වර්ධනය කිරීම. | ආ. 2011 වර්ෂය තුල ශිෂ්‍ය සමත් විම 84 වු අතර 2012 වර්ෂයේදි එය 102 දක්වා වර්ධනය විය. |
| | | ඇ. ආරක්ෂක විද්‍යාවේදි (M Def S) හිමිගැත්විම ප්‍රතිශතය ක්‍රමිකව වර්ධනය කිරීම. | ඇ. 2011 වර්ෂය තුල හිමිගැත්විම ශිෂ්‍යයින් 44 වු අතර 2012 වර්ෂයේදි එය 52 දක්වා වර්ධනය විය. |
| | | ඇ. විදේශ ශිෂ්‍ය සහභාගිත්වය ක්‍රමවත්ව වර්ධන කිරීම. | ඇ. 2011 වර්ෂය තුල සහභාගි වු විදේශ ශිෂ්‍යයන් සංඛ්‍යාව 08 වු අතර, 2012 වර්ෂයේ දි එය 11 දක්වා වර්ධනය විය. |

01. අධ්‍යාපනික දර්ශකයන්
**(Academic Indicator)**

ශිෂ්‍ය සහභාගිත්ව දර්ශකය.

අ. මාණ්ඩලික පාඨමාලාවට ත්‍රිවිධ හමුදා නිලධාරි සහභාගි විමේ වර්ධනය.

ශිෂ්‍ය සංඛ්‍යාව




වර්ෂය

ආ. <u>මාණ්ඩලික පාඨමාලාව සඳහා සුදුසුකම් ලැබීම</u>




ඇ. <u>ආරක්ෂක විද්‍යාවේදී (M Def S) හිමි ගැන්වීම</u>.




ඇ. <u>විදේශීය ශිෂ්‍ය සහභාගිත්ව වර්ධන වීම</u>.



| අ/අංකය S/No | කාර්ය සාධක දර්ශකය (Key Performance Indicator ) | කාර්ය සාධක මිණුම් (Measurement) | ලගා වූ ඉලක්කයන් (Target/Milestone reached) |
|---|---|---|---|
| 02 | <u>අධ්‍යාපනික සංවර්ධන දර්ශකය (**Academic Development Indicator**)</u> | | |
| | අ. පුස්ථකාල පහසුකම් සංවර්ධන දර්ශකය (Library Facility Development Indicator ) | අ. පරිශිලනය කරන ලබන පොත් හි ගුණාත්මකව සහ ප්‍රමාණාත්මකව වර්ධනය කිරිම. | අ. 2011 වර්ෂය තුල පැවැති පොත් ප්‍රමාණය පොත් 100 කින් වැඩිකිරිම සහ සමස්ත පුස්ථකාල කටයුතු පරිගණක ජාල ගත කිරිම. |
| | ආ. උපාංග වර්ධන දර්ශකය (Equipments acquirement Indicator) | ආ. පුහුණු විම් කටයුතු සඳහා ඉදුරාම අවැසි නව උපාංගයන් ප්‍රමානාත්මකව සහ ගුණාත්මකව වර්ධනය කිරිම. | ආ. 2011 සහ 2012 වර්ෂ තුලදි විද්‍යාලය වෙත පුහුණු කටයුතු සඳහා ඉදුරාම අවැසි පහත සඳහන් මූලධන භාණ්ඩ මිලදි ගන්නා ලදි.<br>පරිගණක මුද්‍රණ යන්ත්‍ර - 10<br>මල්ටි මිඩියා ප්‍රොජේක්ටර් යන්ත්‍ර - 05<br>ජායාස්ත පිටපත් යන්ත්‍ර- 03<br>ලැප්ටොප් - 26<br>ඩිජිටල් ඩුප්ලිකේටර් යන්ත්‍ර - 01<br>පරිගණක පුටු - 55<br>පරිගණක මේස - 58<br>පොත් රාක්ක - 15<br>යුඑස්බි ඔප්ටිකල් මවුස් - 10<br>මවුස් - 03 |

02. **අධ්‍යාපනික සංවර්ධන දර්ශකය**
**(Academic Development Indicator)**

අ. පුස්තකාල පහසුකම් සංවර්ධන වීම.

සංඛ්‍යාව




වර්ෂය

ආ. **උපාංග වර්ධන දර්ශකය**
**(Equipments acquirement Indicator)**

මුදල
(රු: මිලියන)




වර්ෂය

| අ/අංකය S/No | කාර්‍ය සාධක දර්ශකය (Key Performance Indicator) | කාර්‍ය සාධක මිණුම් (Measurement) | ලගා වූ ඉලක්කය (Target/Milestone reached) |
|---|---|---|---|
| 03 | <u>යටිතල පහසුකම් සහ විද්‍යාලිය පහසුකම් සංවර්ධන දර්ශකයන්</u> <u>**( Infrastructure and facility Development Indicator)**</u> <u>2011 වර්ෂය</u> | | |
| | අ. ශිෂ්‍ය නිලධාරී විවාහක නිල නිවස්න ගොඩනැගිලි 3 ක් ඉදිකිරීම. | අ. 2011 වර්ෂයේ දෙසැම්බර් 31 ට ප්‍රථම නිම කල යුතුයි. | අ. පලමු ගොඩනැගිල්ල 2011.12.22 දෙවන ගොඩනැගිල්ල 2012.02.15. සහ තෙවන ගොඩනැගිල්ල 2012.04.05 වන දින නිමකරන ලදි. |
| | ආ. සිවිමහල් සින්ඩිකේට් ගොඩනැගිල්ල (අදියර 2 කින් නිම කිරීමට සැලසුම් කර ඇත.) | ආ. 2012.12.31 ට ප්‍රථම නිම කල යුතුයි. | ආ. 2012 ඔක්තෝබර් මස වන විට ඉදිකිරීම් වලින් 40% නිම කර ඇත. |
| | ඇ. විද්‍යාලිය සියළු අංශ/ආයතන සහ ශිෂ්‍ය නිලධාරී නිවාස්න සදහා අන්තර්ජාල පහසුකම් ලබාදීමට හා පරිඝණක ජාල ගත කිරීමට අවැසි කටයුතු සිදු කිරීම. | ඇ. 2016.12.31 ට ප්‍රථම නිම කල යුතුයි. | ඇ. 2012.09.31 වන දිනට සම්පුර්ණ කාර්‍යයෙන් 45% නිම කර ඇත. |
| | ඈ. ද්විත්ව මාර්ගය ඉදිකිරීම (අදියර 2 කින් නිම කිරීමට සැලසුම් කර ඇත.) | ඈ. 2011.12.31 ට ප්‍රථම නිම කල යුතුයි. | ඈ. 2012.09.31 වන දිනට ඉදිකිරම් වලින් 60% නිම කර ඇත. |
| | ඉ. විද්‍යාලිය අභ්‍යන්තර මාර්ග කාපට් අතුරා නවීකරණය කිරීම. (අදියර II) | ඉ. 2011.12.31 ට ප්‍රථම නිම කල යුතුයි. | ඉ. 2011.10.31 වන විට 100% නිම කරන ලදි. |
| | <u>2012 වර්ෂය</u> | | |
| | අ. ශිෂ්‍ය නිලධාරී සදහා විවාහක නිලධාරී නිවස්න ගොඩනැගිලි 3 ක් ඉදිකිරීම. | අ. 2012.12.31 ට ප්‍රථම නිම කල යුතුයි. | |
| | ආ. 5000g/h උස්බහන් බෙදාහැරීමේ ජල ටැංකිය 3000g/h භූගත ජල ටැංකිය හා ජල පොම්පාගාරය ඉදිකිරීම. | ආ. 2012.12.28 ට ප්‍රථම නිම කල යුතුයි. | ආ. 2012.09.31 වන දිනට සම්පුර්ණ කාර්‍යයන් 80% නිම කර ඇත. |
| | ඇ. විද්‍යාලිය අභ්‍යන්තර මාර්ග කාපට් අතුරා නවීකරණය කිරීම. (අදියර III) | ඇ. 2012.12.31 ට ප්‍රථම නිම කල යුතුයි. | ඇ. 2012.09.31 වන විට ටෙන්ඩර් මණ්ඩල අනුමැතියට යොමුකොට ඇත. |

| අ/අංකය S/No | කාර්ය සාධක දර්ශකය (Key Performance Indicator) | කාර්ය සාධක මිණුම් (Measurement) | ලගා වූ ඉලක්කය (Target/Milestone reached) |
|---|---|---|---|
| | ඈ. ඉන්ධන මනුකරනය ස්ථාපනය කිරීම හා ඉන්ධන පිරවුම්හලක් ඉදිකිරීම.<br><br>ඉ. 160KVA විදුලි පරිගාමකයක් ස්ථාපනය කිරීම හා පරිගමකයේ සිට විදුලි රැහැන් ස්ථාපනය කිරීම. | ඈ. 2012.12.31 ට ප්‍රථම නිම කල යුතුයි.<br><br>ඉ. 2012.12.31 ට ප්‍රථම නිම කල යුතුයි. | ඈ. 2012 ඔක්තෝබර් මස වන විට ඉදිකිරීම් වලින් 70% නිම කර ඇත.<br><br>ඉ. 2012.09.31 වන විට 50% නිම කර ඇත. (පරිගාමකය ස්ථාපනය කිරීමට ලංකා විදුලිබල මණ්ඩලයට මුදල් නිරවුල් කර ඇත. විදුලි රැහැන් ස්ථාපනය කිරීමට ටෙන්ඩර් මණ්ඩල අනුමැතිය ලබාදී ඇත.) |

03. **<u>යටිතල පහසුකම් සහ විද්‍යාලීය පහසුකම් සංවර්ධන දර්ශකයන්</u>**
**(Infrastructure and Facility Development Indicator)**

අ. <u>ශිෂ්‍ය සුභසාධක පහසුකම් සංවර්ධනය වීම.</u>

උදා- විවාහක නිවාස




ආ. <u>අධ්‍යාපනික යටිතල පහසුකම් සංවර්ධනය වීම.</u>

උදා - ශිෂ්‍ය නිලධාරී පංතිකාමර ගොඩනැගිල්ල



ඇ. <u>විද්‍යාලීය යටිතල පහසුකම් සංවර්ධනය වීම</u>.

උදා - අභ්‍යන්තර මාර්ග පද්ධතිය

මුදල
(රු. මිලියන)




වර්ෂය

## මධ්‍ය කාලීන ආයෝජන සැලැස්ම

1. මෙම විද්‍යාලයේ පවත්වනු ලබන මාණ්ඩලික පාඨමාලාව සඳහා සහභාගී වන ශිෂ්‍ය නිලධාරින් ප්‍රමාණය වාර්ෂිකව වැඩිකර 2016 වර්ෂයේදී ශිෂ්‍ය නිලධාරින් 120 ක් දක්වා සහභාගිකරවා නියමිත පුහුණුවීම් සිදු කිරීමට සැලසුම්කර දැනට විද්‍යාලයේ ක්‍රියාකාරි සැලස්මට අනුව 2011 වර්ෂයේදී පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාවට නන්වන ලදී.

අ. **<u>ද්විත්ව මාර්ගය ඉදිකිරීම රු. මි. 12.3</u>.**

මෙම විද්‍යාලය සතු ඉඩකඩ ප්‍රමාණය ප්‍රමාණවත් නොවූ බැවින් ජාතික තරුණ සේවා සභාව වෙතින් පවරා ගන්නා ලද ඉඩමෙහි දැනට විද්‍යාලයෙහි වාර්ෂිකව පවත්වනු ලබන මාණ්ඩලික පාඨමාලාව සඳහා සහභාගී වන ශිෂ්‍ය නිලධාරින්ගේ නේවාසික පහසුකම් වෙනුවෙන් වූ විවාහක නිවාස ඉදිකර ඇත. ඒ අනුව විද්‍යාලය පිහිටි භූමිය හා ජාතික තරුණ සේවා සභාව වෙතින් පවරා ගන්නා ලද ඉඩම් කොටස මැදිව පිහිටි මඩ කුඹුර හරහා ගමනා ගමන පහසුකම් විධිමත්ව සපුරාදීම වෙනුවෙන් නව ද්විත්ව මාර්ගයක් ඉදිකිරීමට කටයුතු කර ඇති අතර. එහි කාපට් ඇතිරීමේ කටයුතු සිදුකිරීමට පමණක් ඇත.

ආ. **<u>විද්‍යාලීය අන්තර්ජාල පහසුකම් වැඩි දියුණු කිරීම රු.මි. 6.0</u>.**

වාර්ෂිකව වැඩිවන දේශීය හා විදේශීය ශිෂ්‍ය නිලධාරින්ගේ අවශ්‍යතාවයන් සඳහා විද්‍යාලය තුල අතර්ජාල පහසුකම් වැඩි දියුණු කිරීම.

ඇ. **<u>ශිෂ්‍ය නිලධාරි විවාහක නිවාස ඉදිකිරීම රු.මි. 50.0</u>.**

මාණ්ඩලික පාඨමාලාව සඳහා වාර්ෂිකව වැඩිවූ ශිෂ්‍ය නිලධාරින් ප්‍රමාණයට අනුව 2012 වර්ෂයේදී අවශ්‍ය නිවාස 6 බැගින් සමන්විත ගොඩනැගිලි 03 ක් ඉදිකිරීමට කටයුතු කර ඇත.

ඈ. **<u>සිව් මහල් සින්ඩිකේට් ගොඩනැගිල්ල ඉදිකිරීම රු.මි. 25.0</u>.**

මාණ්ඩලික පාඨමාලාව සඳහා සහභාගී වන දේශීය සහ විදේශීය ශිෂ්‍ය නිලධාරින්ගේ පංති කාමර දේශණ ශාලා ශ්‍රවණාගාර සහ වැලි නිර්මාණ සහිත ආකෘති කාමර පහසුකම් සපයාදීම වෙනුවෙන් ඉදිකරනු ලබන මෙම සිව් මහල් ගොඩනැගිල්ලේ පළමු අධියරේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කල අතරණි 3 වන අධියරේ ඉදිකිරීම් කටයුතු සිදුකිරීමට නියමිතව ඇත.

ඉ. **<u>ගෘහස්ථ ක්‍රීඩාගාරය ඉදිකිරීම රු.මි. 7.0</u>.**

2012 වර්ෂයේදී ශිෂ්‍ය නිලධාරින්ගේ ක්‍රීඩා පහසුකම් වෙනුවෙන් සියළු පහසුකම් සහිත නව ගෘහස්ථ ක්‍රීඩාගාරයක් ඉදිකර ඇති අතර. එමගින් පාඨමාලා සඳහා වාර්ෂිකව සහභාගි වන ශිෂ්‍ය නිලධාරින්ගේ ක්‍රීඩා පහසුකම් සපුරාදීමට කටයුතු කර ඇත.

ඊ. **<u>නව මුරහලක් ඉදිකිරීම රු. මි. 3.0</u>.**

නව මුරහලක් සහ විද්‍යාලයේ පිටුපසින් ඇතුළු වීමේ පිවිසුම් ගේට්ටුවක් ජාතික තරුණ සේවා සභාවෙන් පවරා ගන්නා ලද භූමියේ ඉදිකිරීමට කටයුතු කර ඇත.

උ. **<u>ඉන්ධන මනුකරණ ස්ථාපිත කිරීම රු.මි. 3.0</u>.**

2012 වර්ෂයේදී විද්‍යාලය සතු සියළුම වාහන සඳහා අවශ්‍ය ඉන්ධන ලබා ගැනීම වෙනුවෙන් ඉහත මුදල් ප්‍රතිපාදන වැය කර ඩීසල් සහ පෙට්‍රල් දෘඩාංග සහිත ඉන්ධන මනුකරණ 2ක් ඉදිකිරීමට කටයුතු කර ඇත.

ඌ **<u>ගැලුම් 30000 ක භූගත ජල ටැංකිය. ගැලුම් 5000ක උස් මහත් බෙදාහැරීමේ ජල ටැංකිය. ජල පොම්පාගාරය ඉදිකිරීම රු.මි. 5.92</u>.**

2012 වර්ෂයේදී සියළුම විවාහක නිවාස සහ සෙසු නිල හඨ නිවාස සඳහා අඛණ්ඩ ජල පහසුකම් සපුරාදීම වෙනුවෙන් භූගත ජල ටැංකියක්. පොම්පාගාරයක් සහ බෙදාහැරීමේ ටැංකියක් ස්ථාපිත කර ඇත.

**ඇමුණුම උ**

**වාර්ෂික වාර්තාව - 2012**

**2012 විගණකාධිපති වාර්තාව සහ එහි නිරීක්ෂණයන් සඳහා ගනු ලැබූ නිවැරදි කිරීම් පියවර හා වර්තමාන තත්වය**

| ජේද අංකය | නිරීක්ෂණය | නිවැරදි කිරීමට ගත් පියවර | වර්තමාන තත්වය |
|---|---|---|---|
| **(අ)** | **(ආ)** | **(ඇ)** | **(ඈ)** |
| 2.2.1(අ) | විද්‍යාලයට අයත් නොවන වාහන, මූල්‍ය ප්‍රකශනවල ඇතුළත් කිරීම | අවසන් ගිණුම්වලට ඇතුලත් කර ඇති සියළු වාහන විද්‍යාලය මහින් පවරාගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවති. | අදාල වාහන පවරාගැනීම සඳහා අවැසි අනුමැතිය ඉල්ලුම් කර ඇතත්, ඒ අනුව ක්‍රියාකිරීමට අවැසි අනුමැතිය මේ දක්වා ලබාදී නොමැත. |
| 2.2.1(ආ) | **<u>තැන්පතු ගිණුම</u>**<br>කාර්ය මණ්ඩල වැටුප් රහිත නිවාඩු වලට අදාලව කරන ලද අඩුකිරීම් ජංගම නොවන වගකීම් යටතේ තැන්පතු ගිණුමට බැරකර තිබුණි. | අදාළ මුදල් තැන්පතු ගිණුමින් ඉවත් කර 2013 අවසන් ගිණුම්හි නිවැරදිව ගලපන ලදි. | 2013 වර්ෂයේදී අදාළ නිවැරදි කිරීම් සිදු කර ඇත. |
| 2.2.2 (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 8(1) වගන්තිය ප්‍රකාරව වාර්ෂික අයවැය ලේඛණය මුදල් වර්ෂය ආරම්භ වීමට මාස තුනකට පෙර පාලක මණ්ඩලයට ඉදිරිපත් කර නොතිබුණි. | කළමනාකරණ මණ්ඩලය අනුමත කල සංයුක්ත සැලැස්මට අනුකූලව පිළියෙල කළ 2012 වර්ෂයේ දල අය වැය ඇස්තමේන්තුව 2011.07.27 වන දින රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයට ඉදිරි පත් කර ඇත. තවද 2012 වර්ෂයට අනුමත ප්‍රතිපාදන ප්‍රමාණය දැනුම් දීමෙන් පසු අවසන් අයවැය ලේඛනය කළමනාකරණ මණ්ඩලයේ අනු මැතියට ඉදිරිපත් කර ඇත. | 2013 සහ 2014 වර්ෂයෙන් සඳහා වූ වාර්ෂික අයවැය ලේඛනය කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියට ඉදිරිපත් කර ඇත. |
| 2.2.2 (ආ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.1 වගන්තිය ප්‍රකාරව අයවැයගත ශේෂ පත්‍රය, අය වැයගත ආදායම් සහ වියදම් ප්‍රකාශය හා අයවැයගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඇතුළත් කර නොතිබුණි. | විද්‍යාලය ආදායම් උපයන ආයතනයක් නොවන බැවින්, වාර්ෂික අතිරික්තයක් අපේක්ෂා නොකෙරේ. ඒ අනුව රජයෙන් ලැබෙන ආදායම් නිසි පරිදි ඒ ඒ වියදම් අයිතමයන් වෙනුවෙන් යොදා ගැනීම සැසඳීම හා තහවුරු කිරීමට පහසු වන පරිදි පුනරාවර්තන හා ප්‍රාග්ධන ලෙස අයවැය සකස් කරනු ලැබේ. කෙසේ වුවද, අදාල චක්‍රලේඛයේ පරිදි 2014 වර්ෂයේදී දැනට පවත්නා ආකෘතියට අමතරව අයවැයගත ශේෂපත්‍රය, ආදායම් වියදම් ප්‍රකාශය හා මුදල් ප්‍රවාහය ඇතුලත් කිරීමට කටයුතු කරන ලදී | 2014 වර්ෂය සඳහා අයවැය ගත ශේෂපත්‍රය, ආදායම් හා වියදම් ප්‍රකාශන හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| 3.2 | **<u>විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය</u>** මූල්‍ය ප්‍රතිඵලයේ රු.4,392,823 ක පිරිහීම සඳහා පසුගිය වර්ෂයට සාපේක්ෂව සමහර වියදම් රු.22,844,365 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. | විද්‍යාලයේ කටයුතු පවත්වාගෙන යාම වෙනුවෙන් රජයෙන් ලැබෙන ප්‍රදාන සහ වෙනත් ප්‍රදානයන් සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පාඨමාලාව සඳහා සහභාගී කර ගන්නා ලද සිසුන් සංඛ්‍යාව පෙර වර්ෂයට සාපේක්ෂව ඉහළ යාම (83 සිට 102 දක්වා ) සහ සැපයුම් සේවා වියදම් සහ ගිවිසුම්ගත සේවාවන්ට අදාළව වෙළඳපළ මිළ ගණන් ඉහළ යාම මෙම තත්ත්වයට හේතුව වශයෙන් දන්වා සිටිමි. | අදාළ වියදම් හැකිතාක් දුරට කළමනාකරණය කර ගැනිමට අවැසි කටයුතු සිදු කරනු ලැබේ. |
| 4.2(අ) (1) | **<u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>** ගබඩා භාණ්ඩ පරීක්ෂාව | ගබඩාවට භාණ්ඩ ලැබීම සහ නිකුත් කිරීම සම්බන්ධයෙන් විද්‍යාලයේ පාලන අංශය තුළද ලේඛනයන් නඩත්තු කිරීමක් සිදු කෙරෙන හෙයින් 2012 දෙසැම්බර් 31 පැවති තොග නිසි පරිදි ගණනය කොට අවසන් ගිණුම් තුළ දැක්වීමට කටයුතු කර ඇත. | මේ වන විට වර්ෂය අවසානයේදී තොග අගය නිවැරදිව පහසුවෙන් ගණනය කළ හැකි වන පරිදි ගිණුම්කරණ ප්‍රමිතයට අනුකූලව තොග පොත් නඩත්තු කරගෙන යනු ලබන බව තව දුරටත් දන්වා සිටිනු ලැබේ. |
| 4.2 (අ)(11) | එක් එක් අංශයන් සඳහා වෙනම ඉන්වෙන්ට්‍රි ලේඛන නඩත්තු කර නොතිබුණි. | මේ වන විට විද්‍යාලයේ සියලුම අංශයන් තුළ පරිහරණය කරනු ලබන ස්ථාවර වත්කම් පිළිබඳව විස්තර ඇතුළත් කිරීම සඳහා ඉන්වෙන්ට්‍රි ලේඛණයන් ලබා දීමට කටයුතු කොට ඇති අතර එම ලේඛයන් නිසි පරිදි නඩත්තු කරන ලෙසටද අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. | දැනට විද්‍යාලයේ සියළුම ආයතනයන්හි පරිහරනය කරනු ලබන ස්ථාවර වත්කම් වෙනුවෙන් අවශ්‍ය ඉන්වෙන්ට්‍රි ලේඛන මේ වන විට නිසි පරිදි පවත්වා ගෙන යනු ලබයි. |
| 4.3 (අ),(ආ) | **<u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>** සින්ඩිකේට් ගොඩනැගිල්ල ඉදිකිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් වාර්ෂික ප්‍රතිපාදන නැවත මහා භාණ්ඩාගාරයට පැවරීම. | 2011 වර්ෂයේ නාවික හමුදාව වෙත වෙන්කර දුන් මුදල් ප්‍රතිපාදන එම වර්ෂය අවසන් වන තෙක් ව්‍යාපෘතියේ පලමු අධියරේ ඉදිකිරීම් කටයුතු සඳහා පරිහරනය නොකිරීම සම්බන්ධයෙන් විද්‍යාලය විසින් විමසුම් කොට ඇති අතර එම මුදල් වර්ෂය අවසන් වීම හේතුවෙන් ව්‍යාපෘතියේ ඉදිරි වැඩ කටයුතු සඳහා වැය දැරීම පිණිස නාවික හමුදාවේ අභ්‍යන්තර ගිණුමකට බැර කර තබා ගන්නා ලෙසටද දැනුම් දී ඇත. | 2013 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය සඳහා ලබාදුන් මුදල් ප්‍රතිපාදන වර්ෂය අවසානයේ මහා භාණ්ඩාගාරයට බැරනොවූ අතර, 2014 වර්ෂයේ සිට එම ව්‍යාපෘතියේ බිල්පත් පියවීම සඳහා □ශිලි මුදල් ලබාදීම මගින් මෙම තත්වය නිවැරදි කර ගන්නා ලදි. |

| | | | |
|---|---|---|---|
| 4.4 | **<u>අරමුදල් ඌන උපයෝජනය</u>**<br>2010, 2011 හා 2012 වර්ෂ අවසානයේ පිළිවෙලින් රු. මිලියන 27.2 ක්,රු. මිලියන 55.7 ක් හා රු. මිලියන 16.8 ක් ප්‍රයොජනයට නොගෙන භාණ්ඩාගාරයට බැර කර තිබුණි. | විද්‍යාලය වෙත ද්‍රවශීල මුදල් ලෙස ලද සියලු ප්‍රතිපාදන 2010,2011 හා 2012 වර්ෂයන්හිදී වාර්ෂික අයවැය හා ප්‍රසම්පාදන සැලැස්මට අනුකූලව නිසිපරිදි ප්‍රයෝජනයට ගෙන ඇත.<br>එහෙත්, විද්‍යාලයේ ඉදිකිරීම් වෙනුවෙන් වෙනත් ආයතන වෙත සිදුකරන ලද සෘජු වෙන්කිරීම් (Direct Transfer) එම වර්ෂයන් තුලදීම වියදම් නොකිරීම හේතුවෙන් මෙම තත්වය පැන නැගී ඇත. මේ සම්බන්ධව ලිපි හා සාකච්ඡා මගින් අදාල ආයතන පසුගිය වර්ෂයන්හිදී දිගින් දිගටම දැනුවත්කර ඇති අතර, කළමනාකරණ මණ්ඩලයේ අවධානයටද යොමු කරන ලදී. | 2013 වර්ෂයේ වෙනත් ආයතනය වෙත වෙන්කර දුන් මුදල් ප්‍රතිපාදන අතුරින් වැය නොකරන ඉතිරි මුදල් ප්‍රතිපාදන වර්ෂය අවසානයේ භාණ්ඩාගාරයට බැර නොවන පරිදි ලබාගැනීමට කටයුතු කරන ලදී. ඉදිරි වර්ෂයන් තුළදී ඉදිකිරීමට යෝජිත සියලු නව ව්‍යාපෘති විද්‍යාලය විසින්ම සිදුකිරීමට අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇත. |
| 4.5 | **<u>වාහන උපයෝජනය</u>**<br>විද්‍යාලය සදහා ආරක්ෂක අමාත්‍යාංශය මගින් වාහන 17ක් යුද්ධ හමුදාව මගින් වාහන 14 ක් ලබා දී තිබු අතර මෙම වාහනවල අයිතිය විද්‍යාලය වෙත පවරා නොතිබුණි. ත්‍රීවිල් රථයක් 2011 දෙසැම්බර් 17 දින සිට නිකරුනේ ගාල්කර තිබුණි. | මෙම විද්‍යාලය වෙත රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය, යුද්ධ හමුදාව, නාවික හමුදාව සහ ගුවන් හමුදාව වෙතින් ලබාදී ඇති වාහන විද්‍යාලය නමින්ම ස්ථිරවම පවරා ගැනීම වඩාත් සුදුසු බවට විද්‍යාලීය විගණන හා කළමණාකරන කමිටුව විසින් යෝජනා කර ඇත. ඒ අනුව ක්‍රියා කරීමට අවශ්‍ය උපදෙස් රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වෙතින් ඉල්ලුම් කර ඇත.<br>QM 5327 දරණ ත්‍රීරෝද රථය නැවත භාර දීමට කටයුතු කිරීමට ආසේඅමාවි /ප්‍රවා/ක්‍යුඑම්5327 (06) හා 2013.07.21 වන දිනැති ලිපිය මගින් උපදෙස් ඉල්ලා ඇති අතර අදාළ උපදෙස් ලැබුණු පසු එම රථය භාර දීමට කටයුතු කෙරෙනු ඇත. | රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වෙතින් හා ත්‍රිවිධ හමුදාවන් වෙතින් මෙම විද්‍යාලය වෙත අනුයුක්ත කර ඇති සියළුම වාහන නීත්‍යානුකූලව විද්‍යාලය වෙත පවරා ගැනීමට කිහිප අවස්ථාවකදීම ඉල්ලීම් සිදුකර ඇතත්, ඒ සඳහා අනුමැතිය ලබාදී නොමැත. QM 5327 දරණ ත්‍රීරෝද රථය ධාවනට නුසුදුසු බැවින්, එය ආපසු භාරදීම සඳහා අවැසි අනුමැතිය ඉල්ලුම් කර ඇති අතර, ඒ අනුව ඉදිරියේදී කටයුතු කරනු ඇත. |

| | | | |
|---|---|---|---|
| 4.6 | **<u>සේවක මණ්ඩල කළමනාකරණය</u>**<br>විද්‍යාලයේ අනුමත සේවක සංඛ්‍යාව 100ක් වුවද සේවයේ යෙදී සිටි සේවක සංඛ්‍යාව 92ක් විය. | විද්‍යාලයේ අනුමත සේවක සංඛ්‍යාවෙන් දැනට පුරප්පාඩු පවතින සේවක සංඛ්‍යාව බඳවාගැනීම සඳහා වූ අවශ්‍ය කටයුතු සිදුකෙරෙමින් පවති. | විද්‍යාලයේ අනුමත සේවක සංඛ්‍යාවට අනුව පවතින පුරප්පාඩු වෙනුවෙන් අවශ්‍ය සේවක මහත්ම/මහත්මීන් සම්පූර්ණයෙන්ම බඳවාගැනීමට කටයුතු කර ඇත. |
| 5.1 | **<u>වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම</u>**<br>ක්‍රියාකාරී සැලැස්ම සමග සංසන්දනය කළ හැකි වන පරිදි කාර්යසාධන වාර්තා පිළියෙල කර නොතිබුණි. | 2012 වර්ෂයට අදාළව පුනරාවර්තන වියදම් හා ප්‍රග්ධන වියදම් වෙනුවෙන් එක් එක් වකවානු හදුනා ගත හැකිවන පරිදි විද්‍යාලයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කර එය විද්‍යාලය වෙතින් දැනට පිළියෙල කර ඇති සංයුක්ත සැලැසම තුළ අන්තර්ගතව පවතී. | සමාලෝචිත වර්ෂයට අදාළව කාර්ය සාධන වාර්තා සකස් කොට ඇති අතර අදාළ වාර්තාවන් මීට ප්‍රථමව පැවති විගණන විමසුම්වලට අනුව ඉදිරිපත් කර ඇත. |
| 5.2 | **<u>අයවැය ලේඛනමය පාලනය</u>**<br>අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | අනුමත ප්‍රාග්ධන ප්‍රතිපාදන වලින් රු.මිලියන 60 ක් 2012 වර්ෂය තුලදී නොලැබීම මත සත්‍ය වියදම අඩු වීම හේතුවෙන් 27% ක විචලනයක් පෙන්නුම් කෙරේ. | අනුමත ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් වූ විචලනය විද්‍යාලයට පාලනය කල නොහැකි තත්වයකි. |
| 5.3 | වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම | කෙටුම්පත් විගණන විමසුම ඉදිරිපත් කරන අවස්ථාව වන විටද 2010 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව සහ විගණන ගිණුම් පාර්ලිමේන්තුවේ සභාගත කිරීම වෙනුවෙන් රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වෙත යොමුකර ඇති අතර, 2011 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව සහ විගණන ගිණුම් | 2010 සහ 2011 වර්ෂයන් සඳහා වූ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම වෙනුවෙන් රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වෙත මේ වන විට යොමු කොට ඇති බව දන්වා සිටිමි. |